WOMEN IN NEED

# වින්දිත සහය සඳහා වන අත්පොත



# වින්දිත සහය සඳහා වන අත්පොත

කාන්තා පිහිට

2020

තාක්ෂණික සහය හා අනුග්‍රහය:
ආසියා පදනම

වින්දිත සහය සඳහා වන අත්පොත

මෙම ප්‍රකාශනය යුරෝපීය සංගමයේ සහ ආසියා පදනමේ මූල්‍ය ආධාරයෙන් ප්‍රකාශයට පත් කරන ලදී

පළමු සංස්කරණය,

© සියලුම හිමිකම් 2020 ආසියා පදනම සතුවේ.

ISBN 978-955-0168-59-0

**තාක්ෂණික සහය:**

| | | |
|---|---|---|
| ආචාර්ය රමණී ජයසුන්දර - අධ්‍යක්ෂ | - | යුක්තිය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ආසියා පදනම |
| ඉවැන්ජලින් ද සිල්වා | - | වැඩසටහන් කළමනාකාරිනී, යුක්තිය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ආසියා පදනම |
| බවනි එදිරිසූරිය | - | වැඩසටහන් සහකාර, යුක්තිය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ආසියා පදනම |

**උපදේශක සහය හා පහසුකාරීත්වය:**

| | | |
|---|---|---|
| උදේනි තෙවරප්පෙරුම | - | උපදේශිකා හා සම්පත්දායිකා, ආසියා පදනම |
| කුමාරි ඉඩමේගම | - | වැඩසටහන් නිලධාරිනී, ආසියා පදනම |

**අත්පොත සම්පාදනය:**

| | | |
|---|---|---|
| ඉන්දික දයාරත්න | - | උපදේශක හා පුහුණුකරු, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය |

# පෙරවදන

ශ්‍රී ලංකාවේ විවිධ පළාත් තුළ, විශේෂයෙන් කාන්තාවන්ට අත්දැකීමට සිදුවන ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අනේකවිධ හිංසනයන් ආමන්ත්‍රණය කිරීම මෙන්ම ඊට ඍජු ප්‍රතිචාරාත්මක සහය සේවා සැපයීම, එවැනි සේවා කෙරෙහි යොමු කිරීම සහ ඒ පිළිබඳ නිසි පසුවිපරම් ක්‍රියාවලියක් පවත්වා ගෙන යාම පිණිස ''කාන්තා පිහිට'' ආයතනය දක්වන දායකත්වය ඉතා ප්‍රශංසනීයයි. එසේ හිංසනයන්ට ගොදුරු වන කාන්තාවන් කෙරෙහි සහය සේවා සැපයීමෙන් පමණක් සෑහීමට පත් නොවී එවැනි හිංසනයන් වැළැක්වීම පිළිබඳ ජාතික මට්ටමේ අධිවාචන හා උද්දේශන කටයුතු වල ද නිරත වෙමින් රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස මාතර, කොළඹ, බදුල්ල, අනුරාධපුරය, මඩකළපුව සහ යාපනය යන දිස්ත්‍රික්කයන් තුළ මෙසේ අනූපමේය සේවයක් සලසමින් සිටින ''කාන්තා පිහිට'' මේ වන විට සිය සාර්ථක සේවා කාලයේ තිස් වසර සපුරමින් සිටියි. මෙම දීර්ඝ හා අඛණ්ඩ සේවා දායකත්වය, හුදු සමාජ සත්කාරක සේවාවක් ලෙස නොසලකා එය හිංසනයන්ට මුහුණ පාන සියළු කාන්තාවන්ගේ අයිතීන් පදනම් කරගත් මානුෂවාදී සමාජ වගකීමක් ලෙස ඉටු කිරීම ''කාන්තා පිහිට'' සතු අතිශය විශ්වාසනීයත්වයේ රහස බව මම විශ්වාස කරමි.

ආයතනයේ සේවා සැපයීමේ ඉදිරි ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කර ගනිමින් එය වඩා ඵලදායී හා කාර්යක්ෂම මෙන්ම වින්දිත කේන්ද්‍රීය සේවාවක් බවට පත් කර ගැනීම මෙම අත්පොතේ මූලික අරමුණයි. මේ සඳහා ''කාන්තා පිහිට'' ආයතනයේ අත්දැකීම් බහුල සේවක මණ්ඩලයේ වටිනා අදහස් ද යොදා ගැනීම අතිශය වැදගත් බව වටහා ගැනීමෙන්, ආසියා පදනම රට පුරා විසිරී සිටින 80 කට අධික ඍජු සේවක මණ්ඩලය සමග සිදු කරන ලද දිස්ත්‍රික් මට්ටමේ සම්මුඛ සාකච්ඡාවන් ගණනාවක් මෙන්ම දෙදින නේවාසික වැඩමුළුවකින් උකහා ගත් සාක්ෂි මත පදනම් වූ කරුණු අනුසාරයෙන් මෙම පොත සම්පාදනය වී ඇත. ඊට අමතරව සේවා සැපයීමේ ප්‍රවේශ යාවත්කාලීන කර ගැනීම සහ ලිංගික හිංසනයේ වින්දිතයින් කෙරෙහි

වන අත්‍යාවශ්‍ය සේවා සම්බන්ධීකරණය ආදී යාන්ත්‍රණයන් මෙන්ම නව ප්‍රවණතාවයන් කෙරෙහි සේවක මණ්ඩලයේ අවධානය යොමු කර ගැනීම ද මින් අපේක්ෂා කෙරේ.

විශේෂයෙන්ම මෙය, කාන්තාවන්ට එරෙහි හිංසනයන්ට මුහුණ පෑ වින්දිතයින් කෙරෙහි සේවා සැපයීමේ ආයතණික ක්‍රියාවලිය තුළ විවිධ භූමිකාවන්හි නිරත සේවා සපයන්නන් සඳහා වන සරල මාර්ගෝපදේශයක් වන අතර දැනුවත්ව ස්වයං-තීරණ ගැනීම පිණිස අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා අදාළ වින්දිතයින්ට ද භාවිතා කල හැක.

මෙම අත්පොත සම්පාදනයේදී නන් අයුරින් සිය සහයෝගය ලබා දුන් ''කාන්තා පිහිට'' ආයතනයේ විධායක අධ්‍යක්ෂිකා නීතිඥ සවිත්‍රි විජේසේකර ඇතුළු සමස්ත කාර්‍ය මණ්ඩලයට මාගේ හෘදයාංගම ස්තූතිය පළ කිරීමට මා මෙය අවස්ථාවක් කර ගන්නා අතර ආයතනයේ ඉදිරි කටයුතු වඩා සාර්ථකව කර ගෙන යාමට සුභාශිංසනය පතමි.

**ආචාර්ය රමණී ජයසුන්දර**
අධ්‍යක්ෂ - යුක්තිය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය
ආසියා පදනම

2019, ඔක්තොබර් 04

# මෙම අත්පොත කවුරුන් සඳහාද?

මෙම අත්පොත මූලික වශයෙන් කායිකව, මානසිකව, ලිංගිකව සහ වෙනත් විවිධ හිංසනයට පත් වූ කාන්තාවන් සහ ගැහැණු ළමුන් කෙරෙහි සේවා සපයන ''කාන්තා පිහිට'' ආයතනයේ විවිධ නියෝජිතයින් සඳහා වන අතර ඉන් විවිධාකාරයේ ගෘහස්ත හිංසනයන්ගේ සිට නවීන සන්නිවේදන තාක්ෂණය (ඩිජිටල්) හරහා ලිංගිකව හිංසනයට ලක්වූ වින්දිතයින් කෙරෙහි සාධාරණයක් ඉටු කිරීම පිළිබඳ සැලකිල්ලට භාජනය වේ. මෙම වින්දිතයින් බොහෝ විට ගැහැණු ළමයින්, නව යොවුන් වියේ හෝ වැඩිහිටි කාන්තාවන් ලෙස හිංසනයන්ට පත් වුවද, පොදුවේ වැඩිහිටියන් ලෙස හෝ වැඩිහිටි සහය යටතේ සේවා අපේක්ෂා කරති. එනම්, ඇතැම් වින්දිතයින් තවමත් නීත්‍යානුකූලව දරුවන් සේ සැලකුව ද මෙම අත්පොතේ අභිප්‍රාය වන්නේ ළමා ලිංගික අපයෝජන හෝ වෙනයම් හිංසනයන් ද ඇතුළුව විශේෂයෙන් වැඩිහිටි කාන්තා වින්දිතයින්ගේ මූලික අවශ්‍යතා සැපයීමට මැදිහත් වීමේදී අදාළ නීතිමය අවශ්‍යතා මෙන්ම වෛද්‍ය හා උපදේශන සහායන් කෙරෙහි යොමු කිරීමේදී සේවා සපයන්නන්ට අත්වැලක් වීමයි.

## මෙම අත්පොත භාවිතා කරන ඔබ;

- ''කාන්තා පිහිට'' ආයතනය වෙනුවෙන් වින්දිතයින් සඳහා සේවා සපයන්නෙක්;
- දැනටමත් ''කාන්තා පිහිට'' සේවාලාභී වින්දිතයෙක්;
- වින්දිතයාගේ ඉල්ලීම මත ඇය වෙනුවෙන් ''කාන්තා පිහිට'' දැනුවත්ව මැදිහත් වන යම් බාහිර පුද්ගලයෙක්;
- වින්දිතයින් වෙනුවෙන් ''කාන්තා පිහිට'' හා එක්ව සේවා සපයන වෙනත් ආයතන නියෝජිතයෙක්

විය හැක.

## මෙම අත්පොත සම්පාදනය කලේ ඇයි?

ලිංගික හිංසනය ඇතුළු කායික හා මානසික හිරිහැරයන්ගෙන් වින්දිතභාවයට පත් අය සඳහා සහය වීම පිණිස මෙම අත්පොත සැකසී ඇත. විවිධ හිංසනයන්ගේ පළවිපාකයක් ලෙස වින්දිතභාවයට පත් අයට යම් සහයක් පතා ආර්ථික වශයෙන් දුෂ්කර හා මානසික වශයෙන් ඉතා වෙහෙසකර ක්‍රියාවලියක් හරහා ගමන් කරන විට නිසි හා ප්‍රමාණවත් තොරතුරු, චිත්තාවේගී සහය මෙන්ම ප්‍රායෝගික උපකාර අවශ්‍ය වේ. දරිද්‍රතාවයෙන් පෙළෙන, සංක්‍රමණික හෝ ආදිවාසී, ආබාධ සහිත(විශේෂ අවශ්‍යතා සහිත) හා වෙනත් විවිධත්වයන්ගෙන් යුත් කණ්ඩායමක සාමාජිකයෙකු වන වින්දිතයෙකුට මෙම ක්‍රියාවලිය වඩා දුෂ්කර විය හැක. ලිංගික හිංසන ඇතුළු යමෙකුගේ වින්දිතභාවය පිළිබඳ ඇයගේ අත්දැකීම්, ඇයගේ මූලික හා ප්‍රායෝගික අවශ්‍යතා කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කල හැකිය.

විශේෂයෙන්ම, ලිංගික හිංසනයන්ට මුහුණ පෑ වින්දිතයින්ට සහය සේවා ලබා දීමේදී ඔවුන්ගේ සංස්කෘතීන්, පවුල් හා ආර්ථික පසුබිම් මෙන්ම අධ්‍යාපණික මට්ටම් ආදී විවිධත්වයන් වටහා ගෙන ඊට ගරු කිරීම අතිශය වැදගත්ය. එහෙයින් මෙම අත්පොත ඔබට සෑම වින්දිතයෙකුටම ලබා දීය හැකි හොඳම සේවාව සැපයීමට මහෝපකාරී වනු ඇත.

ඔබේ පරමාර්ථය වනුයේ වින්දිතයින් සඳහා ඔවුන් තෝරා ගන්නා පරිදි යොමු කිරීමේ මාර්ග, යුක්තිය සහ වෛද්‍ය/සෞඛ්‍ය සේවා පද්ධති කෙරෙහි සහ සිය අයිතීන් භුක්ති විඳීමට උපකාර කිරීමයි.විවිධ අත්දැකීම් සහ පර්යේෂණ වලින් පෙනී යන්නේ වින්දිතයින්ට තොරතුරු, ගෞරවණීය ලෙස සැලකීම, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තුල සහාය සහ ඔවුන්ගේ සියළු අවශ්‍යතා සැපිරෙන සේ මනාව සම්බන්ධීකරණය වූ ප්‍රවේශයක් අවශ්‍ය බවයි.

මෙම අත් පොතෙන් වින්දිතයින්ට සහය වීමේදී වින්දිත සේවා සපයන්නෙකුගේ කාර්‍යභාරය, වගකීම්, යුතුකම්, ප්‍රතිපත්තීන් සහ මූලධර්මයන් ආදී වශයෙන් වූ කරුණු පිළිබඳ ඉතා සරලව හා

සැකෙවින් ආමන්ත්‍රණය කෙරෙන අතර එම වැදගත් භූමිකාව ඉටු කිරීම පිණිස සේවකයෙකු සූදානම් කිරීම සඳහා මෙය තනිව භාවිතා කිරීම අදහස් නොකෙරේ. විශේෂයෙන්ම මෙම අත්පොත ''කාන්තා පිහිට'' ආයතනයේ සමස්ත සේවක මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් යුත් විශේෂිත උපදේශක සාකච්ඡා සහ දෙදින නේවාසික පුහුණුවකින් පසු ඉන් ඉස්මතු වූ වැදගත් අදහස් ද අන්තර්ගත කරමින් සැකසෙන්නේ එම නිසාය. එමෙන්ම, එම සියළු උපදේශක සාකච්ඡා හා පුහුණු සැසිවාරයන්හිදී අනාවරණය වූ පරිදි කාන්තාවන්ට එරෙහි විවිධ හිංසනයන් මූලික වශයෙන් ගෘහස්ත හා සමාජීය වශයෙන් සිදුවන කාන්තාවන්ට එරෙහි ලිංගික හිංසන වටා නිර්මාණය වීමේ වැඩි ප්‍රවණතාවයක් මෙන්ම වැඩි සිද්ධීන් සංඛ්‍යාවක් වාර්තා වන බැවින් මෙම අත්පොතෙන් ලිංගික හිංසනය ආමන්ත්‍රණය කෙරෙහි වැඩි ඉඩක් ලබා දී ඇති බව ඔබට පෙනෙනු ඇත.

**මෙම අත්පොත කොටස් දෙකකින් සමන්විතව සම්පාදනය වී ඇත :**

1 වන කොටස : හිංසනයන්ගේ සන්දර්භය - ස්වභාවය, ගතිකත්වයන් සහ සමාජ සන්දර්භය

2 වන කොටස : ඵලදායී සේවාවන් සැපයීම සඳහා වන වින්දිත කේන්ද්‍රීය ප්‍රවේශය සහ එහි වටිනාකම් සහ මූලධර්ම

# පටුන

1 වන කොටස:
**හිංසනයන්ගේ සන්දර්භය - ස්වභාවය,**
**ගතිකත්වයන් සහ සමාජ සන්දර්භය** 1

1. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ විවිධ හිංසන වර්ගීකරණයන් 1
2. ලිංගික හිංසනයන්හි වින්දිතයින් යනු කවුරුන්ද? 3
3. කාන්තාවන්ට එරෙහි හිංසන පිළිබඳ සමාජ විශ්වාස සහ සාරධර්ම 4
4. හිංසනයේ බලපෑම 6
5. ද්විතීයික හිංසනය 8

2 වන කොටස:
**ඵලදායී සේවාවන් සැපයීම සඳහා වන වින්දිත කේන්ද්‍රීය**
**ප්‍රවේශය ඇතුළු වටිනාකම් සහ සහ මූලධර්ම** 11

1. වින්දිතයින්ට අවශ්‍ය දේ 11
2. වින්දිත සේවා සපයන්නාගේ වටිනාකම් සහ විශ්වාසයන් 14
3. වින්දිත කේන්ද්‍රීය ප්‍රවේශය ඇතුළු මුලධර්ම 16
4. හිංසනයන්ට ප්‍රතිචාර දැක්වීමේදී වින්දිත සේවා සපයන්නාගේ කාර්යභාරය 27
5. සේවා සපයන්නකු විසින් “කලයුතු දේ” සහ “නොකල යුතු දේ” 34
6. වින්දිතයෙකුගේ දෘෂ්ඨිකෝණය 41
7. සේවාදායක ඔබේ ආරක්ෂාව පිළිබඳ අවධානය 46
8. සේවා සපයන්නන් අතර සම්බන්ධීකරණය 49

1 වන කොටස:

# හිංසනයන්ගේ සන්දර්භය - ස්වභාවය, ගතිකත්වයන් සහ සමාජ සන්දර්භය

## 1. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ විවිධ හිංසන වර්ගීකරණයන්

### ලිංගික හිංසනය

**ලිංගික හිංසනය;** අනවශ්‍ය/බලහත්කාර ලිංගික ස්පර්ශයන්, අනවශය/බලහත්කාර සිප ගැනීම්, ලිංගිකත්වය ගැබ්වූ උසුළු විසුළු හා ලිංගික අඩන්තේට්ටම්, ලිංගික අපයෝජන, ස්ත්‍රී දූෂණ, අනාරාධිත ලිංගික ඉල්ලීම්/බලපෑම් මෙන්ම විවාහකයින් සහ/හෝ සමීප ලිංගික සහකරුවන් අතර වන ලිංගික හිංසනයන් ආදී විවිධාකාරයෙන් සිදු විය හැක. ලිංගික හිංසනයකදී ඇතැම් විට අපරාධ කරු වින්දිතයා යටත් කර ගැනීමට උත්සාහ කිරීමේදී  කායික තුවාල ද සිදුවිය හැකි නමුත් සෑම විටකම බරපතල මානසික හානියක් ඇති කරයි.

මෙවැනි ලිංගික හිංසන;

- වෙනත් පහර දීම් හෝ හිරිහැරයකට වඩා බෙහෙවින් වෙනස් බව අමතක කල නොහැකිය.
- අනෙක් සියළුම පහරදීම් හා අඩන්තේට්ටම් මෙන් එයද ප්‍රචණ්ඩකාරී ක්‍රියාවකි.
- එහෙත් එය හුදෙක් සරල ප්‍රචණ්ඩ ක්‍රියාවකට වඩා වැඩි තත්වයකි.
- ලිංගික හිංසන බොහෝ විට ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වුවකි.

- එය මානව ගරුත්වයට එරෙහි ක්‍රියාවක් වන අතර කාන්තා සමානාත්මතාවය පිළිබඳ සංකල්පයන් ප්‍රතික්ෂේප කිරීමකි.

- වෙනත් හිංසනයන් මෙන්ම ලිංගික හිංසන අපරාධය ද බලයෙන් අඩු අයට එරෙහිව වඩා බලවත් අය විසින් සිදු කරන ආක්‍රමණශීලී ක්‍රියාවකි.

- බොහෝ අවස්ථාවන්හිදී පිරිමින් විසින් කාන්තාවන්ට එරෙහිව සිදු කරයි.

- එහෙත්, සමලිංගික හා සංක්‍රාන්ති ලිංගික ප්‍රජාව සම්බන්ධයෙන් මෙම තත්වය වෙනස් ස්වරූපයක් ගත හැක.

## කායික හිංසනය

ලිංගික ස්වභාවයක් නොගන්නා ශාරීරික හිංසනයකි. ශාරීරික වේදනාවක් හෝ තුවාලයක් මෙන්ම ඇතැම් විට මරණය පවා ගෙන දෙන ප්‍රචණ්ඩකාරී හෝ නොසැලකිලිමත් ක්‍රියාවක් හරහා මෙවැන්නක් සිදුවිය හැක. මෙයද බලය පෑම හරහා තවකෙකු පාලනය කිරීමට උත්සාහ කිරීමේ අනිසි ඵලවිපාකයක් වන අතර නිදසුන් වශයෙන් පහර දීම, අතුල් පහර දීම, ගෙල හිර කිරීම, පිළිස්සීම, සපාකෑම, හිසකෙස් වලින් ඇදීම, අත පය ඇතුළු වෙනත් ශරීර අංග කැපීම, වෙඩි තැබීම, ඇසිඩ් ප්‍රහාර සහ වෙනත් ආකාරයේ ශාරීරික වේදනා ඇති කිරීම් දැක්විය හැකි නමුත් ඊටම සීමා නොවිය හැක.

## මානසික හා චිත්තාවේගීය හිංසනය

මෙය යම් වාචික, ශාරීරික, ලිංගික, හෝ අවාචික ආදී ඕනෑම හානිකර ක්‍රියාවක් හරහා මානසික හෝ චිත්තාවේගී වේදනාවක් සහ/හෝ බලපෑමක් ඇති කිරීමකි. සාමාන්‍යයෙන් විවාහක හෝ සමීප සහකරුවකු මෙන්ම අධිකාරීමය තනතුරක් දරණ පුද්ගලයෙකු විසින් කායික නොවන ආකාරයෙන් සිදු කරන හිංසන ද මෙයට ඇතුළත් වන මුත් එපමණකට සීමා නොවේ.

### සමාජීය හෝ ආර්ථික හිංසනය

කායික නොවන ආකාරයකින් සිදුකරන ලද හිංසනයක් හෝ කාන්තාවන් සහ ගැහැණු ළමුන් මෙන්ම වෙනත් අවදානමට ලක්වන කණ්ඩායම් නොසලකා හරින/ප්‍රතික්ෂේප කෙරෙන නීති සහ ප්‍රතිපත්ති, ආදායම්/ ඉපයීම්, මුල්‍යමය සේවා, වත්කම් භුක්තිය, දියුණුව පිණිස සමාජ අවස්ථා හා පොදු සම්පත් භාවිතයට බාධා කිරීම මෙන්ම අධ්‍යාපනය, සෞඛ්‍යය සේවා, රැකියාව, දේපල අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීමආදිය හරහා පවුලේ සාමාජිකයින්, ප්‍රජා සාමාජිකයින් මෙන්ම ආයතන බලධාරීන් හරහා මෙවැනි හිංසන ඇති විය හැක.

## 2. ලිංගික හිංසනයන්හි වින්දිතයින් යනු කවුරුන්ද?

ලිංගික හිංසනයන්හි වින්දිතයින් බහුතරයක් කාන්තාවන් බව ඉතා පැහැදිලිය. එබැවින් මෙම අත්පොතේ ලිංගික හිංසනයෙන් වින්දිතභාවයට පත් වූවන් සාමාන්‍යයෙන් කාන්තාවන් සේ හැඳින්වේ. ඉන් අදහස් කෙරෙන්නේ පිරිමින්ට ද ලිංගික හිංසන නොවන බව නොවේ. එසේම, කුඩා දරුවන් ද විශාල වශයෙන් ලිංගික හිංසන වල වින්දිතභාවයට පත් වන අතර ඉන් සැලකිය යුතු ප්‍රමාණයක් පිරිමි දරුවන්ය. කෙසේ වුවත්, ''කාන්තා පිහිට'' හා සිදු කල සාකච්ඡා වලින් හෙළිදරව් වූයේ ලිංගික හිංසනයට පත්ව ඔවුන්ගේ සේවය පතා පැමිණෙන බහුතරයක් වින්දිතයින් යෞවන වියේ සහ මැදිවියේ පසුවන කාන්තාවන් බවය. කෙසේ වුවත්, තරුණියන් කිසිසේත්ම ලිංගික හිංසනයේ එකම ඉලක්කය නොවේ. වෛද්‍ය සහ නෛතික වාර්තා මෙන්ම ''කාන්තා පිහිට'' ආයතනයේ සැලකිල්ලට භාජනය වූ විවිධ වින්දිතයින්ගේ පෞද්ගලික කතා වලින් පැහැදිලි වන්නේ පොදුවේ විෂම ලිංගික කාන්තාවන් මෙන්ම සමලිංගික කාන්තාවන්, සංක්‍රාන්ති ලිංගිකයින්, ආබාධ සහිත කාන්තාවන් ඇතුළු සියළු සමාජ-ආර්ථික හා විවාහක සන්දර්භයන්හි විශාල පරාසයක් තුළ සෑම වයස් කාණ්ඩයකම කාන්තාවන් ලිංගික හිංසනයේ ගොදුරු බවට පත්වන බවයි.

# 3. කාන්තාවන්ට එරෙහි හිංසන පිළිබඳ සමාජ විශ්වාස සහ සාරධර්ම

විවිධ ප්‍රජා කොට්ඨාශ තුළ හිංසනයේ ස්වභාවය සහ ව්‍යාප්තිය අවබෝධ කර ගැනීම සඳහා කාන්තාවන්ට එරෙහි හිංසනයේ සමාජ සන්දර්භය වටහා ගැනීම වැදගත්ය. කාන්තාවන් සහ පිරිමින් අතර ඓතිහාසිකව පවතින බල අසමතුලිතතාවය කාන්තාවන්ට එරෙහි ලිංගික හිංසනයට බලපා ඇති ප්‍රබලම සාධකයයි. ඊට අමතරව, වයස, ජීවන රටාව, පංතිය, හැකියාව, ලිංගික දිශානතිය සහ දරිද්‍රතාවය මත ඉස්මතු වන යැපීම් තත්වයන් ආදීයේ බලපෑම ලිංගික හිංසනයන් කෙරෙහි කාන්තාවන්ගේ අවදානයට ලක්වීම තව තවත් උග්‍රකරනු ඇත.

## ලිංගික භූමිකාව ඒකාකෘතීකරණය

කාන්තාවන්ට එරෙහි වෙනත් ආකාරයේ හිංසනයන් මෙන්ම, ලිංගික හිංසනය ද පහත සඳහන් කරුණු මත ඔවුන්ගේ ලිංගික භූමිකාව ඒකාකෘතීකරණය වීම හරහා සිදුවේ;

- කාන්තාවන්ගේ දුර්වල සමාජ-ආර්ථික තත්වය සමග පවතින ඍජු සම්බන්ධතාවය.
- කාන්තාවන්ගේ ජීවිත සෑම අතින්ම පිරිමින්ගේ ආධිපත්‍යයට නතුව පවතීම.
- යම් හෙයකින් ඔවුන්ගේ එම බල අධිකාරය අභියෝගයට ලක්වන විට ප්‍රචණ්ඩත්වය හෝ බලහත්කාරය පෑමට පිරිමින්ට ''අයිතියක්'' ඇතැයි ඔවුන් තුල පවතින විශ්වාසය.

මෙසේ ලිංගික භූමිකාව ඒකාකෘතීකරණය මගින් ඉතා අවාසනාවන්ත ලෙස සමාජ හා ලිංගික අන්තර්ක්‍රියා වලදී ;

- කාන්තාව ''යටහත්'' හවුල්කරුවන්ගේ භූමිකාව නිරූපණය කිරීම.

- කාන්තාව පිරිමින්ගේ ආධිපත්‍යයට ලක්වූ පිරිමින් විසින් ''උරුම කරගත්'' ඔවුන් මත ''යැපෙන'' අය බවට පත්වීම.

- සිය කතා විලාසයන්, ඇඳුම් පැළඳුම් හා හැසිරීම් හරහා පිරිමින්ට කාන්තාවන් කෙරෙහි නොවැළැක්විය හැකි ''ලිංගික ආකර්ශණයක්'' ඇති කරන බවට සමාජ මිත්‍යාවන් ගොඩනැගීම.

- එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ ලිංගික හැසිරීම් ''පාලනය'' කර ගත නොහැකි වනවා යැයි ඉතා අරුත් සුන් විශ්වාසයක් පැවතීම.

ආදී ඒකාකෘතිමය අදහස් හරහා කාන්තාවන් සහ පිරිමින් අතර විවාහය තුළ මෙන්ම ඉන් පරිබාහිරව ද ඔවුනොවුන්ගේ ලිංගිකත්වයට ප්‍රවේශ වීමේ අයිතිය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කරයි.

## වින්දිතයාට දොස් පැවරීමඃ

කිසියම් ලිංගික ක්‍රියාවක් සඳහා කාන්තාවන් කිසිඳු බලපෑමකින් තොරව සිය තනි කැමැත්තෙන් එකඟ විය යුතු බව නීතියෙන් පැවසුවද, ''හොඳ'' කාන්තාවක් ලිංගිකව හිංසනයට පත් නොවන බවත්, ලිංගික අතවරයකට පත්වන කාන්තාවක් එය ''ඕනැකමින් ඉල්ලා'' සිට ඇති බවත් ඉතා අසාධාරණ ලෙස තවමත් විශ්වාස කරයි. ඒ සඳහා සමාජය සපයන හේතූන් වන්නේ;

- වැරදි වෙලාවන් (රාත්‍රී) වලදී වැරදි ස්ථානයක සිටීම

- පොළඹවන ආකාරයේ ඇඳුම් ඇඳීම

- රෑ බෝවී හුදකලාව සිටීම

- බොහෝ ලෙස රූපලාවන්‍ය භාවිතය

- දුර්වල විනිශ්චය

- ''නරක'' හැසිරීම (ආලවන්ත හැඟීම් පෑම, ක්ෂණිකව මුණගැසුනු අයෙක් සමග වාහනයේ යෑමට එකඟ වීම, නැටුමට එක් වීම සහ මත් පැන් පානය ආදී)

- කලින් අවස්ථාවකදී අදාළ පුද්ගලයා සමග ලිංගිකව හැසිරීමට එකඟ වී තිබීම හෝ;
- දෙමාපිය අවසරයකින් තොරව හමුවීමකට එකඟ වීම

යම් ආකාරයකින් හිංසනය කෙරෙහි තමාගේ හැසිරීමද යම් පෙළඹවීමක් කලායැයි වරදකාර හැඟීමක් කාන්තාවන්ට පවා ඇතිවන්නට පුළුවන. මෙසේ වින්දිතයාටම දොස් පැවරීම හෝ තමන් විසින්ම දොස් පවරා ගැනීම ලිංගික හිංසන පිළිබඳ සමාජයේ බොහෝ ආකල්ප කෙරෙහි බලපා ඇත. මෙසේ ලිංගික හිංසනයක වින්දිතයෙකු වරදකාරීත්වය, ලැජ්ජාව හෝ අපහසුතාවයට ලක්වීමට ඇති බිය හා අකමැත්ත නිසාම එවැනි හිංසන පිළිබඳ වාර්තා කිරීම වෙනුවට එය දිගින් දිගටම ඉවසා සිටීමට බොහෝ විට කාන්තාවන් තීරණය කරති.

# 4. හිංසනයේ බලපෑම

## පොදුවේ සමස්ත කාන්තාවන්ට ඇති කරන බලපෑමඃ

ලිංගික හිංසනය ඇතුළු කාන්තාවන්ට එරෙහි හිංසන මූලික වශයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අපරාධ වන අතර එය පිරිමින්ගේ ජීවිත වලට වඩා කාන්තාවන්ගේ ජීවිත වලට බලපායි. සෑම ආකාරයකම හිංසනයන් කාන්තාවන්ට සමාජය තුළ සම සහභාගීත්වය කෙරෙහි අහිතකර ලෙස බලපායි. උදාහරණයක් ලෙස; ලිංගික හිංසනය පිළිබඳ අවදානම හෝ තර්ජනය සියළු කාන්තාවන්ට ඔබමොබ යාමේ නිදහස හා ආර්ථික අවස්ථාවන් සීමා කරයි. ලිංගික හිංසනය ඇතුළු විවිධ හිංසනයන් කෙරෙහි කාන්තාවන් තුළ පවතින බිය ඔවුන්ගේ සමාජ ක්‍රියාකාරකම්, ඔවුන් අඳින පළඳින ආකාරය, පිරිමින් සමග ඇති සබඳතා, ගෘහස්තව කෙරෙන තෝරා ගැනීම් සහ පොදු ප්‍රජා පහසුකම් සඳහා වන ප්‍රවේශය කෙරෙහි ප්‍රබලවම බලපාන බව ඉතා පැහැදිලිය.

## වින්දිතයින් කෙරෙහි ඇති කරන බලපෑම:

ඇයගේ ජීවන සංස්කෘතිය, පවුල් සබඳතා, ආධාරක හා සහය පද්ධතිය, වයස, හිංසනයට පත් වීමෙන් අනතුරුව ඇය හා සම්බන්ධ වන පුද්ගලයින්ගේ ප්‍රතිචාරයන් සහ හිංසනයේ ස්වභාවය අනුව වින්දිතයෙකු කෙරෙහි වන හිංසනයේ බලපෑම වෙනස් වේ. කෙසේ වෙතත්, පොදුවේ ගත් කල යම් හිංසනයකින් වින්දිතභාවයට පත් වීම බොහෝ දුරට ඔවුන්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍යයට අහිතකර ලෙස බලපායි. ඒ හරහා ඔවුන්ගේ ආත්ම අභිමානය, පවුලේ අය, මිතුරන් හා සමාජයේ සෙසු පාර්ශවයන් සමග ඔවුන්ගේ සබඳතා, දෛණික ජීවිතයේ සාමාන්‍ය ක්‍රියාකාරකම් වල යෙදීමට ඔවුන්ට ඇති හැකියාව හීන කරයි. මෙම තත්වයේ අනිසි පළවිපාකයක් ලෙස වින්දිතයින්ගේ තීරණ ගැනීමේ අයිතිය දරුණු ලෙස උල්ලංඝනය වන අතර සියළු දෛණික කාරණා තුළ දැඩි යැපුම් මානසිකත්වයක් ගොඩනගා ගනී.

## වින්දිතයින්ගේ පවුලේ අයට සහ හිතවතුන්ට ඇති කරන බලපෑම:

හිංසනයෙන් වින්දිතභාවයට පත් අයට පමණක් නොව එය ඔවුන්ගේ සමීපතමයන්ට ද නොයෙක් ආකාරයෙන් බලපායි. සිය හවුල්කරුවන් ඇතුළු පවුලේ සාමාජිකයින්ට වින්දිතයාට හා සමානවම ප්‍රතික්‍රියා අත් විඳීමට සිදුවිය හැක. කෝපය, අසරණභාවය, කම්පනය, අවිශ්වාසය, වරදකාරීත්වය, බිය හෝ ලැජ්ජාව වැනි හැඟීම් ඉන් සමහරකි. විශේෂයෙන් සාම්ප්‍රදායික පවුල් තුළ ලිංගික හිංසන සම්බන්ධව ලැජ්ජාව නිසා ඔවුන් හෝ පවුල අපකීර්තියට පත්ව ඇතැයි ඔවුන්ට හැඟෙන්නට පුළුවන. හිංසනයකට පත් කාන්තාවකගේ වේදනාව දැකීම හවුල්කරුවෙකුට, පවුලේ වෙනත් සාමාජිකයෙකුට හෝ සමීප හිතවතෙකුට බොහෝ විට අපහසුය.

## සමීප සහකරු සබඳතා තුළ හිංසන:

විශේෂයෙන් ලිංගික හා කායික හිංසන බොහෝ විට සිදු වන්නේ අඛණ්ඩ අපයෝජනයක කොටසක් ලෙස සමීප සබඳතාවයක් තුළ“ය.

හිංසනයේ අඛණ්ඩ පැවැත්ම මානසික හා චිත්තවේගී හිංසනයේ සිට ඉඳ හිට කම්මුල් පහර දක්වා හෝ රළු ලිංගිකත්වය හෝ දැඩි ශාරීරික පහරදීම්, ස්ත්‍රී දූෂණ (වෛවාහක දූෂණය ද ඇතුළුව) සහ මනුෂ්‍ය ඝාතන දක්වා විය හැක. බොහෝ විට කාන්තාවක් අවසානයේ තමන් මුහුණ දුන් හිංසනය ගැන ''කාන්තා පිහිට'' වෙත, වෛද්‍ය සේවා සපයන්නන්ට සහ /හෝ පොලිසියට වාර්තා කරන විට, වාර්තා කර සිටින්නේ තමා අත්විඳී ශාරීරික හිංසනයන් පමණක් වන අතර ලිංගික අතවරයන් හෙළිදරව් කිරීමට ලැජ්ජාවක් සහ චකිතයක් ඇති බවයි. ශාරීරික පහරදීම් වලට වඩා ලිංගික අතවර හරහා ඇති වන තුවාල බොහෝ විට පහසුවෙන් සැඟවිය හැක. මෙම හේතු මත බොහෝ විට ලිංගික හිංසනයන් පිළිබඳ සත්‍ය තත්වය පොලිස් සංඛ්‍යා ලේඛන වල සැලකිය යුතු ලෙස වාර්තා වී නැති බව අප දනී.

## 5. ද්විතීයික හිංසනය

ද්විතීයික හිංසනය සිදු වන්නේ පවුලේ අය, මිතුරන්, සේවා සපයන්නන් හෝ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ හිංසනයට ප්‍රතිචාර දැක්වීමේ දුර්වලතා හේතුවෙනි. ඇතැම් විට පහත සඳහන් ආකාරයේ ද්විතීයික හිංසනයන්ට කාන්තාවන් ලක් විය හැක;

- වින්දිතයාට නිසි තොරතුරු නොලැබී යාම.
- තොරතුරු හා සේවා ප්‍රවේශය නොලැබී යාමෙන් ඇතිවන අසාධාරණය පිළිබඳ හැඟීම.
- ආරක්ෂක පියවරයන් නොමැති කම
- පොලිසිය හා උසාවි මගින් උනන්දුවක් නොමැති බව වැටහී යාම
- අධිකරණ ක්‍රියාවලිය ප්‍රමාද වීම හරහා ඇතිවන පීඩනය හා කනස්සල්ල
- අදාළ පද්ධතීන් තුළ නිසි ක්‍රියාකාරීන්ගේ සබඳතා හා ප්‍රතිචාර නොමැති කම

- හිංසනයේ බලපෑම හේතුවෙන් තමාට ලැබෙන ආදායම හෝ රැකියාව අහිමිව යාම

- ලිංගික අතවර පිළිබඳව වෛද්‍ය හෝ අධිකරණ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වීම හෝ පොලිසියේදී අතිශය පෞද්ගලික කාරණා පිළිබඳව දිගින් දිගටම ප්‍රශ්ණ කර සිටීම

මෙවැනි තත්වයන් නිසා වින්දිතයෙකුගේ ආත්ම අභිමානයට හානියක් විය හැක. තවද, හිංසනය සම්බන්ධයෙන් ඉහත සඳහන් පරිදි ඇයටම දොස් පැවරීම හෝ අපකීර්තිය, අනාරක්ෂිත බව හෝ සැකය හේතුවෙන් ඇය පවුලේ අය, හිතමිතුරන් හෝ සමාජය විසින් හුදකලා කිරීමට ද ඉඩ ඇති අතර එම තත්වය ඇයගේ අවදානම් සහගත බව තව තවත් උග්‍ර කිරීමට හේතු වනු ඇත.

# සටහන්

2 වන කොටස:

# ඵලදායී සේවාවන් සැපයීම සඳහා වන වින්දිත කේන්ද්‍රීය ප්‍රවේශය ඇතුළු වටිනාකම් සහ සහ මූලධර්ම

## 1. වින්දිතයින්ට අවශ්‍ය දේ

විවිධ හිංසනයන්ගෙන් වින්දිතභාවයට පත් වූ කාන්තාවන් කෙරෙහි ප්‍රතිචාර දැක්වීම  සඳහා පහත සඳහන් ආකාරයේ පුළුල් තේමාවන් හතරක් අවශ්‍ය වේ;

- වින්දිතයින් කේන්ද්‍ර කර ගත් ප්‍රවේශයක්
- හැකි හොඳම ප්‍රතිචාරය ලැබුනේ යැයි වින්දිතයාට හැඟෙන පරිදි සේවා සැපයීම
- ප්‍රගතිශීලී ප්‍රතිචාරයක්
- ඔවුන්ගේ හඬට සවන් දුන් බවක් ඔවුන්ට හැඟෙන ප්‍රතිචාරයක්

මෙම පුළුල් තේමාවන් හතර තුළ වින්දිතයින්ට ප්‍රතිචාර දැක්වීමේ අංග තුනක් නිරතුරුවම වැදගත් වේ. ඒ තොරතුරු සැපයීම, ප්‍රතිචාර දැක්වීමේ කාලෝචිත බව සහ ගෞරවාන්විතව සැලකීමයි.

හිංසනයට ගොදුරු වන කාන්තාවන් අපේක්ෂා කරන දේ පහත ලැයිස්තුවෙන් සාරාංශ කරයි;

- **ආරක්ෂාව** - වින්දිතයින්ගේ ආරක්ෂාව ඉතා වැදගත් වන අතර බලය මත පදනම් වූ හිංසන පිළිබඳ අපරාධ සම්බන්ධයෙන් ආරක්ෂිත සැලසුම් කිරීම සහ අපරාධකරුගේ අඛණ්ඩ තර්ජන ඉතා සැලකිළිමත් ලෙස තක්සේරු කල යුතුය. ආරක්ෂිත සැලසුම්

වලදී සෑම කාන්තාවකගේම පාරිසරික යථාර්ථයන් මනාව සැළකිල්ලට ගත යුතුය.

- **තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඇතුළත් කිරීම** - වින්දිතයාගේ අදහස් සක්‍රීයව ලබා දීමට ඉඩසැලසිය යුතු අතර ඔවුන්ගේ එම අදහස් සෑම තීරණ ගැනීමක්ම තුළ අන්තර්ගත විය යුතුය

- **ගෞරවනීය ලෙස සැළකීම** - වින්දිතයාගේ අත්දැකීම් වල වලංගුභාවය ඇති කිරීම සහ ඇයගේ ජීවිතය සමග සාර්ථකව කටයුතු කිරීමේ හැකියාව සැලසීම, ඇය සවිබල ගැන්වීමේ තීරණාත්මක අංග වේ. මෙහිදී රහස්‍යභාවය සුරැකීම ගෞරවනීය ලෙස සැලකීමේ කොටසකි.

- **ප්‍රායෝගික, නිවැරදි හා සවිස්තරාත්මක තොරතුරු** - කාලෝචිත තොරතුරු, පහසුවෙන් වටහා ගත හැකි වචන වලින් කතා කිරීම හිංසනයන්ට මුහුණ පෑ අයගේ මූලික අවශ්‍යතාවයන්ගෙන් එකකි. වින්දිතයාට අවශ්‍ය වන්නේ ඔවුන්ට පරිශීලනය කිරීමට සිදුවන පද්ධති, එම පද්ධති හරහා ඔවුන්ගේ නඩුකර වල ප්‍රගතිය, පද්ධති ප්‍රතිචාරයන් සහ සම්පත් යන දෙකෙන්ම මුහුණ දීමට විය හැකි ''සාමාන්‍ය'' ප්‍රතික්‍රියා සහ තමා ආරක්ෂිතව තබා ගැනීමට සහ සිය ජීවිත සමග ඉදිරියට යාමට සහය වන ප්‍රවේශයයි.

- **කාලෝචිත ප්‍රතිචාර** - පොලිස් ප්‍රතිචාරයේ කාලෝචිත බව, අය කිරීම් සහ අධිකරණ ක්‍රියාවලීන් සහ සහය සේවා හා යොමු කිරීම් සියල්ලක්ම වින්දිතයාගේ ආරක්ෂාව සහ ඇය යුක්තිය පසිඳලීමේ ක්‍රමය සාර්ථකව භාවිතා කිරීම පිණිස අතිශය වැදගත් වේ.

- **පුළුල් පරාසයක සම්පත් කෙරෙහි ප්‍රවේශය** - ලිංගික හිංසනයන්ගෙන් වින්දිතභාවයට පත්වූවන් සඳහා ප්‍රජාවන්හි සේවාවන් සහ ඔවුන් සපයන දේ පිළිබඳ සේවා සපයන්නන් දැනුවත්ව සිටිය යුතුය.

- **නීතිමය ක්‍රියාවලිය පුරා සහාය** - වින්දිතයාට පූර්ව නඩු විභාග යේ සිට පශ්චාත් නඩු විභාගය තෙක් සහය නියෝජනය ඇතුළු

චිත්තවේගීය හා ප්‍රායෝගික සහය අවශ්‍ය වේ. ඇයට අවශ්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමට නොහැකි නම් හෝ අදාළ පද්ධති ඇය වෙනුවෙන් නිසි ලෙස ක්‍රියාත්මක නොවන්නේ නම් වින්දිතයාට නීතිඥවරියක් අවශ්‍ය විය හැක.

- **සංස්කෘතිකමය වශයෙන් සුදුසු සේවාවන්** - විවිධ සංස්කෘතික පසුබිම් වල වින්දිතයින්ට භාෂාව අනුව පමණක් නොව විවිධ සංස්කෘතිකමය පීඩණ හා ගැටුම් වලට සංවේදී  වන සේවා අවශ්‍යය.

- **ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා සපුරන සේවාවන්** - ආබාධ සහිත කාන්තාවන්, ඉතා තරුණ කාන්තාවන්, වැඩිහිටි කාන්තාවන්, වීදී සරන කාන්තාවන්, සමලිංගික කාන්තාවන්, සංක්‍රාන්ති පුද්ගලයින් සහ ග්‍රාමීය හා හුදලකා කාන්තාවන් යනාදී සියල්ලන්ගේම නිශ්චිත අවශ්‍යතා සපුරාලිය යුතුය. වින්දිතයින් සියළු දෙනාගේම මූලික අවශ්‍යතාවයක් වන්නේ සිය විශේෂිත තත්වයන්ට සංවේදී වීමයි.

- **ආරක්ෂාව පිළිබඳ හැඟීම** - හැකිතාක් දුරට ලිංගික හිංසනයෙන් වින්දිතභාවයට පත් අයගේ සිය ආරක්ෂාව පිළිබඳ හැඟීම යථා තත්වයට පත් කල යුතුය. කාන්තා මධ්‍යස්ථාන, හිංසනය පිළිබඳ උපදේශන පැවැත්වීම, ආත්මාරක්ෂක පාඨමාලා සහ නිවාස ආරක්ෂණ හා අපරාධ වැළැක්වීම පිළිබඳ වැඩසටහන් වැනි මෙම අවශ්‍යතාවය සැපිරිය හැකි ප්‍රජා සම්පත් පිළිබඳව සේවා සපයන්නන් දැනුවත් විය යුතුය.

- **පසු විපරම** - සේවා සපයන්නන් වින්දිතයින් සමග නිරන්තර පරීක්ෂාවකින් අදාළ කටයුතු නිසි ලෙස සිදුවන්නේ දැයි සොයා බැලීමටත්, අපරාධකරුවන්ට සිදුවන්නේ කුමක්ද යන්නත්, වැරදිකරුවන් නිදහස් කරන්නේ නම් ඒ කවදාද? සහ කුමන කොන්දේසි යටතේද? යන්න වින්දිතයින්ට දැනුම් දීම වැදගත්ය.

## 2. වින්දිත සේවා සපයන්නාගේ වටිනාකම් සහ විශ්වාසයන්

ඇතැම් විට වින්දිතයින් සඳහා සේවා සපයන්නෙකු පවා වින්දිතයාට දොස් පැවරීමේ උගුලට හසු විය හැක. විශේෂයෙන් ඇයට උපකාර කිරීමට ගත් උත්සාහයන් සාර්ථක නොවූයේ නම් අදාළ සේවා සපයන්නා කලකිරීමට පත් විය හැක. හිංසනයකට පත් වූ කාන්තාවන් අන් සියළු මනුෂ්‍යයන් මෙන්ම පරිපූර්ණ පුද්ගලයින් නොවනු ඇත. ඔබ ඇයගේ ඇතැම් දේ පිළිබඳ අකමැති විය හැක. ඇතැම් විටෙක, කාන්තාවකගේ තේරීම් යටත් පිරිසෙයින් අර්ධ වශයෙන් හෝ ඇය හිංසනයට පත් වීම කෙරෙහි බලපා ඇතැයි ඇයටම පවා සිතෙනු ඇත. එසේ හෙයින්, හිංසනයකට පත් වූ කාන්තාවන්ට ඵලදායී සහය සේවා සහ චිත්තවේගාත්මක සහය ලබාදීම පිණිස ඔබ ඔබේම සාරධර්ම සහ විශ්වාසයන් පිළිබඳ ස්වයං-පරීක්ෂාවක යෙදීය යුතුය. විශේෂයෙන්ම, වින්දිතයින් හා කටයුතු කිරීමේදී සේවා සපයන්නෙකුගේ පහත සඳහන් වැදගත් වටිනාකම් අපේක්ෂා කරයි;

- පූර්ව නිගමණයන්ට එළැඹීමෙන් සහමුලින්ම වැලකී සිටීම
- වින්දිතයාගේ රහස්‍යභාවය රැකීම
- විශ්වාසනීයත්වය
- සමානාත්මතාවය
- වින්දිතයින් යථා තත්වයට පත් කිරීමේ අවංක වෑයම
- වින්දිත අයිතීන්ට ගරු කිරීම
- සංවේදීතාවය
- කොන්දේසි විරහිත ගෞරවනීය පිලිගැනීම
- නම්‍යශීලීභාවය
- වින්දිතයා මානසිකව හුදකලා නොකිරීම

එසේම, පහත දැක්වෙන්නේ වින්දිතයින් සමග ඵලදායී හා විශ්වාසනීය ලෙස කටයුතු කිරීම සඳහා පදනම සපයන සාරධර්ම සහ විශ්වාසයන්ගේ කෙටි ලැයිස්තුවකි;

- කිසිම විටෙක, කිසිඳු හේතුවක් මත, කාන්තාවකගේ හැසිරීම හිංසනයට හේතු ලෙස හෝ ඊට සාධාරණීයකරණයන් සැපයීමට යොදා නොගනී. කිසිම කාන්තාවක් ලිංගික අතවරයට ලක් වීමට සුදුසු නැත.

- කිසිම විටක කාන්තාවන් ලිංගික අතවරයට ලක් කරන ලෙස ඉල්ලා නොසිටින අතර ලිංගික අතවර වලින් ඇයට කිසිඳු සතුටක් නොලැබේ.

- හේතු ගණනාවක් නිසා කාන්තාවන් ප්‍රචණ්ඩකාරී සබඳතා පවත්වයි. ශ්‍රම බලකායේ සාර්ථකත්වය පිණිස පිරිමින්ට සාපේක්ෂව කාන්තාවන්ගේ නිපුණතාවයන් අඩු බවටත්, සිය සැමියා හෝ පෙම්වතාගේ ආධිපත්‍යයට එරෙහි නොවිය යුතු බවටත්, පිරිමියෙකු නොමැති ජීවිතය අසම්පූර්ණ බවටත් සමාජ මිත්‍යා මතයන් සන්නිවේදනය කෙරේ.

- විවිධ කාන්තාවන් තම පවුල් සහ සිය ප්‍රජාවන් තුළ විවිධ අවශ්‍යතාවයන් සහ අපේක්ෂාවන් අත්විඳීති. ඵලදායී සහයක් ලබා දීමට ඔබට ඇති හැකියාව රඳා පවතින්නේ එම අවශ්‍යතාවයන් සහ අපේක්ෂාවන් පිළිබඳ ඔබගේ අවබෝධය සහ එක් එක් කාන්තාවගේ අත්දැකීම් කෙරෙහි ඔබ දක්වන අව්‍යාජ ගෞරවය මතයි.

- බොහෝ සංස්කෘතීන් තුළ ස්වාධීනත්වයට හා ස්ථිරභාවයට වඩා පවුලේ සාමාජිකයින් අතර අඛණ්ඩ අන්තර් රඳා පැවැත්ම සහ සහයෝගය අගය කරයි. මෙම අගයන් පිළිබඳ ඔබේම ආකල්පයන් පිළිබඳව ඔබ මනාව දැනුවත්ව සිටිය යුතු අතර විසඳුම් ලෙස ඔබේ විශේෂිත අගයන් විදහා නොපෑ යුතුය.

# 3. වින්දිත කේන්ද්‍රීය ප්‍රවේශය ඇතුළු මූලධර්ම

## මූලධර්ම

පහත සඳහන් එකිනෙකට සම්බන්ධ මූලධර්මයන් වින්දිතයින් කෙරෙහි වන සියලුම අත්‍යාවශ්‍ය සේවාවන් සැපයීම මෙන්ම එම සේවාවන් සම්බන්ධීකරණය පිණිස පිටුවහලක් වේ;

- අයිතීන් පාදක වූ ප්‍රවේශයක්
- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තා බලසතුකරණය වැඩිදියුණු කිරීම
- සංස්කෘතිකමය වශයෙන් හා වයස් අනුව ගැලපෙන මෙන්ම සංවේදී ප්‍රතිචාරයන්
- වින්දිතයා/අගතියට පත්වූවන් කේන්ද්‍ර කරගත් ප්‍රවේශය
- ආරක්ෂාව අතිශය මූලික කොට සැළකීම
- අපරාධකරුගේ වගවීම

## අයිතීන් පදනම් කරගත් ප්‍රවේශයක්

ගුණාත්මක අත්‍යාවශ්‍ය සේවා සැපයීමක් සඳහා වන අයිතීන් පදනම් කරගත් ප්‍රවේශයෙන් කාන්තාවන් සහ ගැහැණු ළමුන්ගේ අයිතීන්ට ගරු කිරීම, ආරක්ෂා කිරීම, සහ එම අයිතීන් ඉටු කිරීම පිළිබඳ ප්‍රාථමික වගකීමක් රජයන්ට ඇති බව පිළිගනී. කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට එරෙහි හිංසනය විශේෂයෙන්ම බියෙන් හා හිංසනයෙන් තොර ජීවිතයකට එම කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට ඇති මූලික මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකි. මානව අයිතීන් පාදක කර ගත් ප්‍රවේශයක් සැම විටම කාන්තාවන් සහ ගැහැණු ළමුන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙන අතර කාන්තාවන් සහ ගැහැණු ළමුන් කෙරෙහි ගෞරවනීයව හා සංවේදීතාවයකින් යුතුව

සලකනු ලබන සේවා ඇති කරයි. එමෙන්ම එය ඉහළ ප්‍රමිතියකින් යුත් සෞඛ්‍ය, සමාජ, අධිකරණ සහ පොලිස් සේවාවන් ළඟා කර ගැනීමද පහසු කරවයි.

කාන්තාවන් සහ ගැහැණු ළමුන් සඳහා වන ගුණාත්මක, පහසුවෙන් පිවිසිය හැකි සහ පිළිගත හැකි සේවාවන්

## ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තා බලසතුකරණය වැඩිදියුණු කිරීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානාත්මතාවය කේන්ද්‍රගත වීම සහ වෙනස්කොට සැලකීම යන සාධක දෙකම කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට එරෙහි හිංසනයන්හි ප්‍රධාන හේතුව සහ ඵළවිපාකයන් වන බැවින්, අදාල සේවා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වශයෙන් සංවේදී වීම මෙන්ම ප්‍රතිචාරාත්මක ප්‍රතිපත්තීන් සහ ක්‍රියාමාර්ගයන් නිසි පරිදි ස්ථාපිතව තිබීම අවශ්‍යය. කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට එරෙහි හිංසනයන් සඳහා සමාව ලැබීමක්, ඉවසා දරා සිටීමක් හෝ දිගින් දිගටම සිදුවීමක් නොවන බවට මෙම සේවා තහවුරු කල යුතුය. යම්හෙයකින් අත්‍යාවශ්‍ය සේවා ප්‍රතික්ෂේප කිරීමේ තීරණය ඇතුලුව කාන්තාවන් සහ ගැහැණු ළමුන් සිය තීරණ තමන් විසින්ම ගැනීමට හැකි වන පරිදි මෙම සේවා මගින් කාන්තාවන්ගේ බලය වැඩිදියුණු කල යුතුය.

## සංස්කෘතිකමය වශයෙන් හා වයස් අනුව ගැලපෙන මෙන්ම සංවේදී සේවාවන්

සංස්කෘතිකමය වශයෙන් හා වයස් අනුව ගැලපෙන මෙන්ම සංවේදීතාවයෙන් යුත් සේවාවන් හරහා කාන්තාවන් සහ ගැහැණු ළමුන්ගේ පුද්ගලික තත්වයන් සහ ජීවන අත්දැකීම් කෙරෙහි ප්‍රතිචාර දැක්වීමේදී ඔවුන්ගේ වයස, අනන්‍යතාවය, සංස්කෘතිය, ලිංගික වරණය, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය, ජාතිකත්වය සහ ඔවුන්ට හුරු භාෂාව ආදී කරුණු පිළිබඳ සැළකිලිමත් විය යුතුය.

එමෙන්ම මෙම අත්‍යාවශ්‍ය සේවා සැපයීමේදී කාන්තාවන් සහ ගැහැණු ළමුන් ඔවුන් ස්ත්‍රීන් නිසාම පමණක්ම නොව  සිය ජාතිය, ජනවර්ගය, කුලය, ලිංගික වරණය, ආගම, ආබාධිත බව, විවාහක-අවිවාහක බව, රැකියාව හෝ අනෙකුත් ලක්ෂණ මෙන්ම ඇය හිංසනයට පත්ව සිටීම නිසා මුහුණ පාන බහුවිධ වෙනස්කොට සැළකීම් කෙරෙහිද යෝග්‍ය පරිදි ප්‍රතිචාර දැක්විය යුතුය.

## වින්දිතයා/අගතියට පත්වූවන් කේන්ද්‍ර කර ගැනීම

වින්දිතයා/අගතියට පත්වූවන් කේන්ද්‍ර කරගත් ප්‍රවේශයන් හරහා සේවා සැපයීමේදී කාන්තාවන් සහ ගැහැණු ළමුන්ගේ අයිතීන් සහ අවශ්‍යතාවයන් මෙන්ම අපේක්ෂාවන් එහි කේන්ද්‍රීය ඉලක්කය බවට පත් කර ගනී. මෙහිදී ඔවුන් මුහුණ දෙන විවිධ ආපදාවන් හා අවදානම් සහගත බව, ඔවුන් ගත් තීරණ හා අනුගමනය කල ක්‍රියාවන් පිළිබඳ බලපෑම් ආදී තත්වයන් පිළිබඳ වින්දිතයින් සහ අගතියට පත්වූවන්ගේ විවිධ වූ අවශ්‍යතාවයන් සැළකිල්ලට භාජනය කිරීම සහ එම සේවාවන් සෑම කාන්තාවක් සහ ගැහැණු ළමයෙකුගේම  සැබෑ අවශ්‍යතාවයන් ඒ ලෙසම ඉටු කරන බවට සහතික විය යුතු අතර සේවාවන් ඇයගේ අපේක්ෂාවන් පිළිබඳවද ප්‍රතිචාර දැක්විය යුතුය.

## ආරක්ෂාව අතිශය මූලික කොට සැළකීම

ගුණාත්මක සේවා සැපයීමකදී කාන්තාවන් සහ ගැහැණු ළමුන්ගේ ආරක්ෂාව අතිශය මූලික කාරණයකි. එහෙයින් අත්‍යාවශ්‍ය සේවා ඒවා පරිහරණය කරන්නන්ගේ ආරක්ෂාව හා රැකවරණයට ප්‍රමුඛතාවය ලබා දීය යුතු සේම ඇය තවදුරටත් පීඩාවට පත්වීම වැළකිය යුතුය

## අපරාධකරුගේ  වගවීම

වින්දිතයින් සඳහා වන අත්‍යාවශ්‍ය සේවාවන්හිදී අධිකරණමය/යුක්තිමය ප්‍රතිචාරයන් තුල සාධාරණත්වය තහවුරු කිරීමේදී සුදුසු අවස්ථා වලදී එළදායී ලෙස අපරාධකරුගේ  වගවීම රඳා පවත්වා ගැනීම අවශ්‍යය. අත්‍යාවශය සේවා අධිකරණමය/යුක්තිමය ක්‍රියාවලිය සමග

වින්දිතයින් සහ අගතියට පත්වූවන්ගේ සහභාගීත්වය සඳහා සහාය හා පහසුකාරීත්වය සැපයීම, එසේ යුක්තිය අපේක්ෂා කිරීමේ බර හෝ වගකීම ඇය මත නොව රජය මත පැටවෙන බව සහතික කරන අතර සිය බලය ක්‍රියාත්මක කිරීම හෝ යොදා ගැනීම පිණිස ඇයගේ ධාරිතාවය වැඩිදියුණු කිරීම අවශ්‍යය.

## ගුණාත්මක අත්‍යාවශය සේවා වල පොදු ලක්ෂණ

අත්‍යාවශ්‍ය සේවා අතර පොදු ලක්ෂණ හා ක්‍රියාකාරීත්වයන් ගණනාවක් පවතී. හිංසනයට මුහුණ පාන කාන්තාවන් සහ ගැහැණු ළමුන් වෙත ප්‍රතිචාර දැක්වීමේදී ඇතැම්විට අදාල විශේෂිත අංශය කුමක්දැයි නොසලකා මේවා යොදා ගත හැකි වනු ඇත. සේවා සැපයීමේදී සමස්ත අත්‍යාවශ්‍ය සේවා සහ ක්‍රියාකාරීත්වයන් පුරාවට පහත සඳහන් මූලික ලක්ෂණයන් තිබිය යුතුය;

- ලබා ගත හැකි බව
- ළඟා විය හැකි බව
- යොදා ගත හැකි බව
- යෝග්‍ය බව
- ආරක්ෂාව ප්‍රමුඛතා ගත වූ බව
- දැනුවත්ව කැමති වීම සහ රහස්‍යභාවය
- ඵලදායී සන්නිවේදනය සහ සේවා සැළසුම්, ක්‍රියාත්මක කිරීම් සහ ඇගයීම් ක්‍රියාවලිය තුල පාර්ශව කරුවන්ගේ සහභාගීත්වය
- දත්ත රැස් කිරීම සහ තොරතුරු කලමනාකරණය
- සම්බන්ධීකරණයන් හරහා අනෙකුත් අංශ හා නියෝජිත ආයතන සමග සම්බන්ධ වීම

## ලබා ගත හැකි බවඃ

අත්‍යාවශය සෞඛ්‍ය, සමාජ සේවා, අධිකරණ හා පොලිස් සේවා සියලුම වින්දිතයින් සහ අගතියට පත්වූවන්ට සිය පදිංචි ස්ථානය,

ජාතිකත්වය, ජනවාර්ගිකතත්වය, කුලය, පංතිය, සංක්‍රමණික හෝ සරණාගත තත්වය, ස්වදේශිකත්වය, වයස, ආගම, භාෂාව සහ සාක්ෂරතා මට්ටම, ලිංගික වරණය, විවාහක- අවිවාහක බව, ආබාධිත බව හෝ වෙනයම් කිසිඳු කාරණයක් නොසලකා ප්‍රමාණවත් හා ගුණාත්මකභාවයෙන් යුතුව ලබා ගත හැකි විය යුතුය.

මාර්ගෝපදේශයන්

- දුරස්ථ, ග්‍රාමීය සහ හුදකලා ප්‍රදේශ ඇතුලුව රජයේ සමස්ත භූමිය තුලම වෙනස්කොට සැළකීමකින් තොරව කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට පුළුල් සේවාවන් වෙත ප්‍රවේශය සහතික වන පරිදි සේවා සැපයීම සැලසුම් කිරීම සහ පවත්වාගෙන යාම කල යුතුය.
- කාන්තාවන් සහ ගැහැණු ළමුන්ගේ වයස, අනන්‍යතාවය, සංස්කෘතිය, ලිංගික වරණය, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය, ජනවාර්ගිකත්වය සහ හුරු භාෂාව ඇතුලු ඔවුන්ගේ පෞද්ගලික තත්වයන් සහ ජීවන අත්දැකීම්ආදිය නොසළකා කිසිඳු ආකාරයක වෙනස්කොට සැළකීමකින් තොරව වඩාත්ම බැහැර කරන ලද, අවදානම් සහගත බව සහ ආන්තිකකරණයට ලක්වූවන් ඇතුළු සියලු ජනගහනයන්ට සේවා සැපයීම සිදු කෙරේ.
- සේවා ජාලය හරහා සහ ඔවුන්ගේ ජීවන චක්‍රය හරහා කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට අඛණ්ඩව ඝ කවරණය ලබා දීම සඳහා සේවා සැපයීම සංවිධානය කර ඇත.
- ජංගම සෞඛ්‍ය සායන සහ උසාවි වැනි සේවාවන් සැපයීම පුළුල් කිරීම සඳහා නව්‍ය සේවා සැපයීම මෙන්ම හැකි විට නවීන තොරතුරු තාක්‍ෂණ විසඳුම් නිර්මාණශීලීව භාවිතා කිරීම සැළකිල්ලට ගැනීම.

## ළඟා විය හැකි බවː

වෙනස්කොට සැළකීමකින් තොරව සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට ප්‍රවේශ විය හැකි සේවාවන් බවට පත් කර ගැනීමට මෙම ළඟා විය හැකි බව අවශ්‍යය. ඒවා භෞතිකව ප්‍රවේශ විය හැකි (සේවාවන් සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට ආරක්ෂිත භෞතික වටපිටාවක් තුල තිබිය යුතුය), ආර්ථික වශයෙන් ප්‍රවේශ විය හැකි (දැරිය හැකි මිලකට) සහ භාෂාමය වශයෙන් ප්‍රවේශ විය හැකි (තොරතුරු සැපයීම විවිධ ආකෘතීන් ගෙන් සිදු කිරීම) විය යුතුය.

මාර්ගෝපදේශයන්

- කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට අනවශ්‍ය මූල්‍ය හෝ පරිපාලනමය බරකින් තොරව සේවාවන් ලබා ගත හැක. ඉන් අදහස් කෙරෙන්නේ මෙම සේවාවන් දැරිය හැකි, පරිපාලනමය වශයෙන් පහසුවෙන් ප්‍රවේශ විය හැකි මෙන්ම පොලිස්, හදිසි සෞඛ්‍ය සේවා සහ සමාජ සේවා වැනි ඇතැම් නිශ්චිත තත්වයන් තුල නොමිලේ සේවා සැපයීමයි.

- මෙම සේවාවන් ලබා ගන්නා අයගේ භාෂා අවශ්‍යතාවයන් හැකිතාක් දුරට සලකා බලමින් සේවා සැපයිය යුතුය.

- සේවා සැපයීමේ ක්‍රියාපටිපාටිය සහ අත්‍යාවශ්‍ය සේවා පිළිබඳ වෙනත් තොරතුරු විවිධ ආකෘතීන් වලින් ලබා ගත හැක (උදාහරණ ලෙස; වාචික, ලිඛිත සහ ඉලෙක්ට්‍රොණික ) සහ ප්‍රවේශයන් උපරිම කිරීම හා විවිධ ඉලක්ක කණ්ඩායම් වල අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස පරිශීලක-හිතකාමී මෙන්ම සරල භාෂාවෙන් සේවා සැපයීම.

## යොදා ගත හැකි බව:

අත්‍යාවශ්‍ය සේවා මගින් කාන්තාවන් සහ ප්‍රජාවන්ගේ විවිධ කණ්ඩායම් වෙත වන හිංසනයේ නානාවිධ බලපෑම් හඳුනා ගත යුතුය. මානව අයිතිවාසිකම් සහ සංස්කෘතිකමය වශයෙන් සංවේදී මූලධර්ම ඒකාබද්ධ වන පරිදි වින්දිතයින් සහ අගතියට පත් වූවන්ගේ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දැක්විය යුතුය.

මාර්ගෝපදේශයන්

- සේවාවන් එක් එක් වින්දිතයා/අගතියට පත් අයගේ ඒ ඒ තත්වයන් සහ අවශ්‍යතාවයන් තනි තනිව වටහා ගෙන ප්‍රතිචාර දක්වයි.
- කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට ඔවුන්ගේ පුද්ගලික තත්වයන්ට වඩාත්ම සරිලන සේවාවන් සඳහා විකල්ප ලබා ගැනීමට අවකාශ සලසන පුළුල් පරාසයකින් යුතු සේවාවන් සැපයේ.

## යෝග්‍ය බව:

කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට යෝග්‍ය අත්‍යාවශ්‍ය සේවා වන්නේ; ඇයගේ අභිමානයට ගරු කෙරෙන, ඇයගේ රහස්‍යභාවය සහතික කෙරෙන, ඇයගේ අවශ්‍යතා හා මතයන්ට සංවේදී මෙන්ම ද්විතීයික හිංසනයන් අවම කෙරෙන ආකාරයෙන් සැපයෙන සෙවාවන්ය.

මාර්ගෝපදේශයන්

- ද්විතීයික වශයෙන් විනිදීතභාවයට පත් වීම අවම කිරීමට උත්සාහ කරනු ඇත. උදාහරණ ලෙස; ඇයගේ කතාව නැවත නැවතත් කීමට සිදු වන වාර ගණන අඩු කිරීම, ඇය සම්බන්ධීකරණය කල යුතු පුද්ගලයින් සංඛ්‍යාව අවම කිරීම සහ පුහුණුව ලත් පිරිසක් ඇති බව සහතික කිරීම

- කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට සිය විකල්පයන් මුළුමනින්ම වටහා ගැනීමට සහාය වීම.
- තමාට ස්වයං උපකාරයන් කර ගත හැකි බව හැඟෙන පරිදි සහ සහාය ඉල්ලා සිටීමට හැකිවන ලෙස කාන්තාවන් සහ ගැහැණු ළමුන් බලසතු කිරීම
- කාන්තාවන් සහ ගැහැණු ළමුන්ගේ තීරණ වලට ගරු කරන්නේ ඇයට ඇති විකල්පයන් ඇය මුළුමනින්ම වටහාගෙන ඇති බව සහතික කර ගැනීමෙන් පසුවය.

ඇයගේ ස්වයං-පාලනයට බාධා නොකර ඇයගේ අවශ්‍යතා හා සිතිවිලි වලට ප්‍රතිචාර දැක්වෙන අයුරින් සේවා සැපයිය යුතුය.

## ආරක්ෂාව - අවදානම් තක්සේරුව සහ ආරක්ෂිත සැළසුම් ප්‍රමුඛතා ගත කිරීම

කාන්තාවන් සහ ගැහැණු ළමුන් සිය ක්ෂණික හා අඛණ්ඩ ආරක්ෂාව සඳහා බොහෝ අවදානම් වලට මුහුණ දෙති. මෙම අවදානම් ඒ ඒ කාන්තාව සහ ගැහැණු ළමයාගේ තත්වයක්ට අනුව විශේෂිත වේ. අවදානම් තක්සේරුකරණය සහ කලමනාකරණය මගින් අවදානම් මට්ටම අඩු කල හැක. අවදානම් තක්සේරුව සහ කලමනාකරණය පිළිබඳ හොඳම අභ්‍යාසයන් සමාජ, සෞඛ්‍ය  සහ පොලිසිය හා යුක්තිය යන අංශ තුල හා ඒවා අතර ස්ථාවර හා සම්බන්ධීකරණය වූ ප්‍රවේශයන්හි ඇතුලත්වේ.

මාර්ගෝපදේශයන්

- සමීප සහකරු හිංසනය සහ සහකරු නොවන හිංසන සඳහා ප්‍රතිචාර දැක්වීම පිණිස විශේෂයෙන්ම සම්පාදිත අවදානම් තක්සේරුකරණ හා කලමනාකරණ මෙවලම් සේවාවන් විසින් භාවිතා කරයි.
- සේවාවන් එක් එක් කාන්තාවන් සහ ගැහැණු ළමයින් කෙරෙහි වන අවදානම් තත්වයන් නිරන්තරව තක්සේරු කරයි.

- සේවාවන් කාන්තාවන් සහ ගැහැණු ළමුන්ගේ ආරක්ෂාව සඳහා සහාය වීම පිණිස අවදානම් කලමනාකරණ විකල්ප, විසඳුම් සහ ආරක්ෂිත ක්‍රියාමාර්ග භාවිතා කරයි.

- කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට අවදානම් කලමනාකරණය සඳහා වන උපායමාර්ග ඇතුලත් සිය ශක්තීන් මත පදනම් වූ පුද්ගලික සැලැස්මක් ලැබෙන බවට සේවා සපයන්නන් සහතික විය යුතුය.

- අවදානම් තක්සේරු කිරීම සහ කලමනාකරණ ප්‍රවේශයන් සම්බන්ධීකරණය කිරීම සඳහා සෞඛ්‍ය, සමාජ සේවා හා යුක්තිය සහ පොලිස් සේවා ඇතුළු සියලුම ආයතන සමග සේවාවන් කටයුතු කල යුතුය.

## දැනුවත්ව කැමති වීම සහ රහස්‍යභාවයඃ

සියලුම අත්‍යාවශ්‍ය සේවා සැපයිය යුත්තේ හැකිතාක් කාන්තාවන් සහ ගැහැණු ළමුන්ගේ පෞද්ගලිකත්වය රැකෙන, රහස්‍යභාවය සහතික වන සහ ඇයගේ කැමැත්තෙන් තොරතුරු හෙළි කෙරෙන පරිදිය. කාන්තාවන්ගේ හිංසන පිළිබඳ අත්දැකීම් අතිශය සංවේදී විය හැක. මෙම තොරතුරු අනිසි ලෙෂ හුවමාරු කර ගැනීමෙන් කාන්තාවන්ට හෝ ඇයට සහය දක්වන අයට බරපතල බලපෑම් සහ  ජීවිත තර්ජන ඇති විය හැක.

මාර්ගෝපදේශයන්

- තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා (පවතින නීති වලට අනුකූලව) කුමන තොරතුරු හුවමාරු කර ගන්නේද, එය කෙසේ කරන්නේද සහ කවුරුන්ද යනාදී කරුණු ඇතුළුව ආචාර ධර්ම පද්ධතියක් සේවා වලට ඇත.

- කාන්තාවන් සහ ගැහැණු ළමුන් සමග සෘජුව වැඩ කරන සේවා සපයන්නන්ට මෙම ආචාර ධර්ම පද්ධතිය පිළිබඳව දැනුවත් කරනු ඇත.

- ඒ ඒ කාන්තාවන් සහ ගැහැණු ළමුන් පිළිබඳ තොරතුරු වල රහස්‍යභාවය ආරක්‍ෂා කරන අතර අදාල තොරතුරු ආරක්ෂිතව ගබඩා කරනු ඇත

- කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට ඔවුන්ගේ විකල්පයන් වටහා ගැනීමට මෙන්ම සිය අනාවරණයන් පිළිබඳ ඇඟවීම් මුළුමනින්ම වටහා ගැනීමට සහාය වේ.

- සේවා සපයන්නන් රහස්‍යභාවය පිළිබඳ සිය වගකීම වටහා ගෙන ඒවාට අනුකූලව කටයුතු කරයි.

## දත්ත රැස් කිරීම සහ තොරතුරු කළමනාකරණයඃ

සේවාවන් අඛණ්ඩව වැඩිදියුණු කිරීමට සහය වීම සඳහා කාන්තාවන් සහ ගැහැණු ළමුන් වෙත සපයන සේවා පිළිබඳ ස්ථාවර හා නිවැරදි දත්ත රැස් කිරීම වැදගත්ය. කාන්තාවන් සහ ගැහැණු ළමුන් පිළිබඳ තොරතුරු මෙන්ම ඔවුන් වෙත සපයන සේවා පිළිබඳ දත්ත නිවැරදිව හා රහස්‍යභාවයෙන් යුතුව වාර්තා කර ගැනීම මෙන්ම ආරක්‍ෂතව ගබඩා කර තැබීම සඳහා වන පැහැදිලි හා ලේඛණගත ක්‍රියාවලීන් සේවා වල තිබිය යුතුය.

මාර්ගෝපදේශයන්

- සියලු තොරතුරු සහ දත්ත රැස් කිරීම, වාර්තා කිරීම සහ ගබඩා කිරීම සඳහා ලේඛණගත හා ආරක්ෂිත ක්‍රමයක් ඇති බව සහතික කිරීම.

- සේවාදායක ලිපි ගොනු, නෛතික සහ වෛද්‍ය වාර්තා සහ ආරක්‍ෂණ සැලසුම් ඇතුළු සේවා වෙත පිවිසෙන කාන්තාවන් සහ ගැහැණු ළමුන් පිළිබඳ සියලුම තොරතුරු ආරක්ෂිතව ගබඩා කර තැබීම.

- දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයන් සහ අවබෝධ කර ගැනීමට සහ ඒවා භාවිතයට කාර්ය මණ්ඩලයන්ට සහය දීම දත්ත එක්රැස් කර ගැනීම පිණිස ඔවුන්ට ප්‍රමාණවත් කාලයක් ලබා දීමෙන් නිවැරදි දත්ත රැස් කර ගැනීමක් සහතික කිරීම.

- දත්ත හුවමාරු කර ගන්නේ ආයතන අතර එකඟ වූ ලිඛිත ගිවිසුම් භාවිතා කිරීමෙන්ම පමණක් බව සහතික කිරීම.

- ප්‍රචණ්ඩත්වයේ පැතිරීම, අත්‍යාවශ්‍ය සේවා භාවිතයේ ප්‍රවණතා, පවත්නා සේවාවන් ඇගයීම සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග දැනුම් දීමආදිය අවබෝධ කරගැනීමට සහය වීම පිණිස දත්ත විශ්ලේෂණය ප්‍රවර්ධනය කිරීම.

## යොමු කිරීම් හා සම්බන්ධීකරණයන් හරහා අනෙකුත් අංශ හා නියෝජිත ආයතන සමග සම්බන්ධ වීම:

යොමු කිරීමේ මාර්ග වැනි සම්බන්ධීකරණයන් තුලින් වෙනත් අංශ හා නියෝජිත ආයතන සමග සම්බන්ධ වීම, කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට කාලෝචිත හා යෝග්‍ය සේවා ලබා ගැනීමට සහය වේ. යොමු කිරීමේ ක්‍රියාවලීන් තුලට දැනුවත් කැමැත්ත පිළිබඳ ප්‍රමිතීන් ඇතුළත් කල යුතුය. වින්දිතයින් සහ අගතියට පත් අය සඳහා විවිධ අත්‍යාවශ්‍ය සේවා සුමටව ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා එක් එක් සේවාවේ පැහැදිලි ප්‍රතිචාර දැක්වීමේ හැකියාවන්ද ඇතුළුව අදාළ සමාජ, සෞඛ්‍ය, සහ යුක්ති සේවා සමග යොමු කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ ලිඛිත එකඟතා සහ ගිවිසුම් ක්‍රියාත්මක විය යුතුය.

මාර්ගෝපදේශයන්

- තොරතුරු හුවමාරු කර ගැනීම සහ යොමු කිරීම සඳහා වන සේවාවන් අතර ක්‍රියා පටිපාටීන් ස්ථාවර වන අතර ඒ පිළිබඳව නියෝජිත ආයතන දැනුවත්

මෙන්ම කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට පැහැදිලිව සන්නිවේදනය කරනු ලැබේ.

- යොමු කිරීමේ ක්‍රියාවලීන්ගේ ඵලදායීතාවය සම්බන්ධීකරණය සහ අධීක්ෂණය සඳහා යාන්ත්‍රණයන් සේවාවන් සතුව ඇත
- මෙම සේවාවන් මගින් ළමුන් සඳහා විශේෂිත සේවාවන් වෙත යොමු කිරීම අවශ්‍ය හා සුදුසු පරිදි සිදු කරයි.

මූලාශ්‍රය: කාන්තාවන්ට එරෙහි හිංසනයට
මුහුණ දෙන වින්දිතයින් සඳහා වන අත්‍යාවශ්‍ය සේවා පැකේජය
(1වන මොඩියුලය - හැඳින්වීම සහ සාරාංශය)

## 4. හිංසනයන්ට ප්‍රතිචාර දැක්වීමේදී වින්දිත සේවා සපයන්නාගේ කාර්යභාරය

වින්දිතයින් සඳහා සේවා සපයන්නන්, ප්‍රදේශයේ සිටින යුක්තිය පිළිබඳ හවුල්කරුවන් සම ප්‍රජා නියෝජිත ආයතන සමග සමීපව සහ සහයෝගයෙන් කටයුතු කරමින් හිංසනයන්ට ලක් වූ කාන්තාවන්ට නිසි තොරතුරු හා උපකාරක සේවා සැපයීම සහතික කරයි. වින්දිතයින්ට අපරාධ යුක්ති පද්ධතියට පිවිසීමට පෙර සිට එම ක්‍රියාවලිය අවසන් වන තෙක් අවශ්‍ය තොරතුරු සහ සහය ලබා දිය යුතුය. වින්දියෙකුට පොලිසියට හෝ රෝහලකට යාමට තීරණයක් ගැනීම සඳහා පවා තොරතුරු හා සහය අවශ්‍ය විය හැක.

වින්දිතයා ආදිවාසී, සංක්‍රමණික, වෙනස් වර්ණයකින් යුත් කාන්තාවක්, ආබාධ සහිත (විශේෂ අවශ්‍යතා සහිත) කාන්තාවක්, සමලිංගික හෝ සංක්‍රාන්ති ලිංගික අයෙක් නම් එම වින්දිතයාට වෙනස්කොට සැලකීම වැනි අමතර ආතතීන් සමග කටයුතු කිරීමට සිදුවනු ඇත. මෙවැනි අවස්ථා වලදී සේවා සපයන්නාගේ කාර්‍යභාරය වන්නේ;

- නිසි පිළිගැනීම
- ගෞරවාන්විත බව
- සහයෝගී බව පළ කිරීම
- නිසි තොරතුරු හා උපදෙස් සැපයීම
- අදාළ යොමු කිරීම් සඳහා යුහුසුළු වීම

ආදියයි.

වින්දිත සහය ක්‍රියාවලියේ  සෑම අදියරකදීම සේවා සපයන්නාට කල හැකි වැදගත්ම දෙය වන්නේ කාන්තාවන්ට සිය හැඟීම් නිදහසේ ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම සහ ඒවාට ගරු කිරීමයි. වින්දිතයෙකුට තමා පහර කෑමට ලක්වීමක් පිළිබඳව කතා කිරීමට අවස්ථාවක් නොමැති කම ඔවුන්ගේ ජීවිත වලට සැලකිය යුතු හානියක් කර ඇත. සංවේදීව හා ගෞරවයෙන් යුතුව කාන්තාවකට ප්‍රතිචාර දැක්වීම අන් අය කෙරෙහි ඇති විශ්වාසය නැවත ගොඩනගා ගැනීමට සහ වඩා වැදගත් ලෙස තමා කෙරෙහි විශ්වාසය තැබීමට ඇයට හැකි පළමු පියවර විය හැක.

එසේ සිය හිංසනය පිළිබඳ අත්දැකීම හෙළිදරව් කිරීමේදී කාන්තාවන් සිය මව් භාෂාව හසුරුවන සේවා සපයන්නන් අපේක්ෂා කරන අතර එම අවශ්‍යතාවයට සංවේදීව කටයුතු කිරීමෙන් සේවාව පිළිබඳ ඇයගේ විශ්වාසය මෙන්ම ඊට සිය සහය දැක්වීමේ දී ඇති වන චකිතය හෝ නුහුරු බව පහව යා හැක.

වින්දිත සේවා සපයන්නෙකු ලෙස, යුක්තිය, වෛද්‍ය සහ වෙනත් සේවා පද්ධති සමග වින්දිතයින්ගේ අත්දැකීම් හැකිතාක් ධනාත්මක කිරීමට ඔබට වැදගත් කාර්යභාරයක් ඇත. ඒ සඳහා නෛතික, වෛද්‍ය සහ සමාජ සේවා පද්ධතීන් තුළ ප්‍රජාවේ නියෝජිත ආයතන සහ කණ්ඩායම් තුළ කටයුතු කරන පුද්ගලයින් සමග විශ්වාසය හා ගෞරවය ගොඩනගා ගැනීම වැදගත්ය. ඔවුන්ගේ භූමිකාවන් පිළිබඳ හැකිතාක් හදාරා ඔවුන් තුළ ඔබ පිළිබඳ හුරුපුරුදු බව තහවුරු කර ගත යුතුය.

ඒ වින්දිතයින් සඳහා කාර්යක්ෂම හා ඵලදායී සහය සේවාවක් සැපයීම පිණිස ඔබට ඇති හැකියාව මෙම කණ්ඩායම් සමග පවතින හොඳ සබඳතාවය මත රඳා පවතින හෙයිනි.

වින්දිතයින්ට උපදෙස් සපයන අයට හිංසනයන් කෙරෙහි දීර්ඝ කාලීනව ප්‍රතිචාර දැක්වීම පිළිබඳ පුහුණුව ලබා තිබීම වැදගත්ය. ඒ මන්ද යත්, එහිදී මතුවන ගැටළු ඉතා සංකීර්ණ වන හෙයිනි. නිසි පුහුණුවක් ලබා නොමැති සේවා සපයන්නන් අදාළ වින්දිතයින් වඩාත් පළපුරුදු උපදේශකයින් වෙත යොමු කිරීමට නිහතමානී හා අවංක විය යුතුය.

වින්දිත සේවා සපයන්නන්ගේ මූලික කාර්යභාරයන් වන්නේ;

- තම සේවාලාභී වින්දිතයින් අපරාධ යුක්ති ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීම
- සමස්ත ක්‍රියාවලිය පුරා තොරතුරු, චිත්තවේගීය සහය සහ ප්‍රායෝගික උපකාර ලබා දීම
- වෛද්‍ය පරීක්ෂණ වැනි අදාළ සේවාවන් පිළිබඳ තොරතුරු සහ ඊට අදාල සහය සැපයීම
- ආරක්ෂිත සැලසුම් සහ වැළැක්වීමේ උපායමාර්ග සංවර්ධනය පිණිස සහය දීම
- අධිකරණමය අත්දැකීම් සඳහා වින්දිතයන් පූර්ව සූදානමට ලක් කිරීම
- අපරාධ වල වින්දිතයින්ගේ ආධාර වැඩසටහන් සඳහා වන අයදුම්පත් සහ වින්දිත ප්‍රකාශ ඉදිරිපත් කිරීම් සඳහා සහය සැපයීම
- හැකි සෑම කැඳවීමකදීම සහ උසාවි කටයුත්තකදීම වින්දිතයා කැටුව යාම
- අන්තර්භාෂා අර්ථ නිරූපණය, සංස්කෘතිකමය වශයෙන් විශේෂිත සේවාවන් සහ ආබාධ සහිත වින්දිතයින් සඳහා ප්‍රවේශය සහ සන්නිවේදන සහය වැනි නානාවිධ වින්දිතයින්ගේ විශේෂ අවශ්‍යතා සැපිරීම

- හැකි සෑම අවස්ථාවකදීම ප්‍රවාහනය හෝ ළමා රැකවරණය වැනි අමතර ආධාර ලබා දීමට උත්සාහ කිරීම
- අවශ්‍ය හා සුදුසු පරිදි වෙනත් ප්‍රජා පාදක සේවා සපයන්නන් සමග සන්නිවේදනය කිරීම හා සම්බන්ධ වීම
- සේවා සපයන්නාට ඍජුව සහය දීය නොහැකි, හිංසනයකින් පසුව ඇතිවන මානසික හා ශාරීරික විපාකයන්ට උපකාර කිරීමට හා ඊට අදාළ විශේෂ අවශ්‍යතා සැපිරිය හැකි වෙනත් සේවා වෙත යොමු කිරීම කල යුතු අතර පසුවිපරම අතිශය වැදගත් වන්නේ වින්දිතයින් ප්‍රති-සමාජගත කිරීම සහ ඔවුන් සවිබල ගැන්වීම කෙරෙහි පහසුකම් සැපයීම  වින්දිත සේවා වල මුඛ්‍ය පරමාර්ථයක් වන බැවිනි.
- සේවා සපයන්නන්ගේ කිසිඳු ක්‍රියාවකින් වින්දිතයාගේ ආරක්ෂාවට කිසිඳු තර්ජනයක් නොවිය යුතු අතර රහස්‍යභාවය පිළිබඳ තමාට ඇති වගකීම පිළිබඳව තරයේ සිහි තබා ගත යුතුය.

## පළමු සම්බන්ධතාවයඃ

හිංසනයකින් වින්දිතභාවයට පත් අයෙකු හා ඔබේ ආරම්භක සම්බන්ධතාවය ක්‍රම කිහිපයකින් සිදුවිය හැකි නමුත් බොහෝ ආරම්භක සබඳතා දුරකථන මගින් සිදු කෙරේ. වින්දිතයාට ඔබේ ආයතනයේ දුරකථන අංකය සහ ආයතනය පිළිබඳ තොරතුරු හිංසනය වාර්තා වූ පොලිස් ස්ථානයෙන් ලබා දුන්නා හෝ ඇයව ප්‍රජා නියෝජිත ආයතනයක් මගින් ඔබ වෙත යොමු කලා හෝ ඇය ස්වේච්ඡාවෙන්ම ඔබව ඇමතුවා විය හැක.

සිදුව ඇති දේ සහ ඇයට අවශ්‍ය දේ පිළිබඳ විස්තරයට හොඳින් සවන් දෙන්න. ඇයට කිසියම් අනතුරක් වී ඇත්දැයි හෝ ඇයට වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය දැයි විමසන්න. නීතිමය හේතූන් මත ප්‍රශ්ණ ඇසීම හෝ සිදුවූ දේ ගැන නොවිමසීම වැදගත්ය.

වහාම චිත්තාවේගීය සහය ලබා දෙන්න. ඔබ ඇයව විශ්වාස කරන බව ඇයට තහවුරු කරන්න. ඇය සිටින අනතුර ගැන ඇය නොදන්නා

බව ඔබට හැඟේ නම් මිස ඇය පසුවන තත්වය පැහැදිලි කිරීමට උත්සාහ නොකරන්න.

**ඔබ එවැනි වින්දිතයෙකු සමග මුලින්ම සම්බන්ධ වූ විට, ඇයගෙන් මෙසේ විමසන්න;**

- ඔබ තවමත් අනතුරක සිටිනවාද? (ඇය තවමත් යම් අනතුරක සිටින බව ඔබට හැඟේ නම් ඇය කුමක් ප්‍රකාශ කලද ඔබ පොලිසිය ඇමතිය යුතුය)
- ඔබ සිටින්නේ ආරක්ෂිත ස්ථානයකද?
- ඔබට යම් වෛද්‍ය ප්‍රතිකාරයක් අවශ්‍ය යැයි සිතෙනවාද?
- ඔබට රෝහලට යාමට අවශ්‍යද?
- සිදු වූ දේ මට කෙටියෙන් පවසන්න ඔබ කැමතිද?
- ඔබට දැනෙන ආකාරය ගැන පැවසීමට කැමතිද?
- මා හෝ වෙනත් අයෙකු ඔබව රැගෙන යාමට හෝ ඔබව හමුවීමට හෝ ඔබ සමග රෝහලට හෝ පොලිසියට යාමට ඔබ කැමතිද?
- රෝහලේදී හෝ පොලිසියෙන් ඔබට අවශ්‍ය දේ පිළිබඳ තොරතුරු ලබා ගත හැකිද?

ඇගේ ප්‍රතිචාර වලට සවන් දීමෙන් පසු ඔබෙන්ම මෙසේ විමසන්න;

- ඇය කතා කලේ ඇයි?
- ඇයට අවශ්‍ය කුමක්ද?
- ඇයට දැනෙන්නේ කුමක් විය හැකිද?
- ඇය කම්පනයට පත්ව ඇත්ද?

වින්දිතයා ඇය සිටින ස්ථානයෙන් ඉවත් කිරීම සුදුසු යැයි ඔබට හැඟේ නම්, වහා පොලිසියේ සහය ලබා ගන්න. පළමුව ඔබේ නම පවසා ඔබ ගැන ඉතා කෙටි විස්තරයක් කරන්න. ඇයගේ නම, ලිපිනය

සහ දුරකථන අංකය ලබාගෙන ඇය වෙත ඔබ සහ/හෝ පොලිසිය පැමිණෙන තෙක් සිටීමට ආරක්ෂිත ස්ථානයක් ඇයගේද සහය ඇතිව සකසා ගන්න.

පොලිස් ස්ථානයට හෝ රෝහලට යාමට පෙර මුව, ඇඟ සේදීම හෝ ස්නානය කිරීම හෝ ඇඳුම් මාරු කිරීමෙන් වැළකී සිටින සේ ඇයට පවසා සිටින්න. ඔබ එසේ පැවසීමට හේතු ඇයට පැහැදිලි කරන්න.

*(ඉහත කාරණා යම් හෙයකින් වින්දිතයා තවකෙකුගේ ආධාරයෙන් ඔබ ඇමතූ හෝ ඇය සෘජුවම ඔබ වෙත පැමිණි විට වුවද හැකිතාක් පිලිපැදීමට උත්සාහ කරන්න)*

## කායික ආරක්ෂාව සහතික කිරීම:

වින්දිතයා සහ ඔබ සම්බන්ධ වන්නේ කෙසේ වෙතත්, ඔබේ පළමු ප්‍රමුඛතාවය විය යුත්තේ ඇයගේ කකායික ආරෂක්ෂාව තහවුරු කිරීමයි. ඇයට අනතුතරක් ඇත්නම් වහාම පොලිසය අමතන්න. වහාම ඇයගේ තොරතුරු පොලිසියට ලබා දීමට ඇයගේ කැමැත්ත ලබා ගන්න. වින්දිතයා තනිව සිටී නම් ඇය හා මිතුරෙකු හෝ පවුලේ අයෙකු කැඳවීමට කැමතිදැයි විමසන්න. ඇයට පරිවර්තන සහය සපයන්නේ නම් එම පුද්ගලයාගේ අපක්ෂපාතී බව හා විශ්වසනීය බව තහවුරු කර ගෙන සිටින්න.

මෙහිදී දරුවන් පිළිබඳ තත්වයන් සලකා බැලිය යුතු අතර පවතින සම්පත් ප්‍රවේශයන් අනුව උපරිම සහය ලබා දීමට පසුබට නොවන්න.

අමතර සහය සඳහා ඇයට සම්බන්ධ විය හැකි වෙනත් සේවා හා සම්පත් පිළිබඳව ඇය දැනුවත් කරන්න.

## ආරක්ෂිත සැලසුම් කිරීම:

වින්දිතයින්ට සහය වීමේදී ඔබගේ තවත් වැදගත් කාර්‍යභාරයක් වන්නේ අවදානම් හඳුනා ගැනීමට ඇයට සහය වීම සහ එම අවදානම් අවම කර ගැනීමට හෝ සහමුලින්ම ඉවත් කර ගැනීමට ගත හැකි

උපායමාර්ගයන් හෝ විකල්පයන් ඇයට ඉදිරිපත් කිරීමයි. මෙහිදී කාන්තාවන්ගේ ආරක්ෂක අවශ්‍යතා දිනෙන් දින හා තත්වයෙන් තත්වයට වෙනස් වන බව ඔබ සිහි තබා ගත යුතුය (උදාහරණ ලෙස; වින්දිතයා ගැබිණි කාන්තාවක් හෝ ආබාධ සහිත/විශේෂ අවශ්‍යතා සහිත අයෙක් නම්).

විශේෂයෙන් යම් වින්දිතයෙක් සිය සම්බන්ධතාවයක් තුළ හෝ ඇය හොඳින් දන්නා අයෙකු අතින් ලිංගික අතවරයකට හෝ කායික හිංසනයකට ලක් වූ අවස්ථාවක, ඇයගේ ආරක්ෂක සැලැස්ම ආගන්තුකයෙකු විසින් ඇයට කායික හිංසනයක් කල අවස්ථාවකට වඩා වෙනස්ව අවධානයට යොමු විය යුතුය. ඊට අමතරව, ආරක්ෂක සැලසුම් තුළ දරුවන්ගේ ආරක්ෂාව සහ මානසික තත්වයන් ද හැකිතාක් සැලකිල්ලට ගත යුතුය.

අපරාධකරුවන්ගේ පාර්ශවයෙන් පැන නගින අවදානම් සාධක මෙන්ම එක් එක් කාන්තාවගේ පෞද්ගලික තත්වයන් අනුව පැන නගින අවදානම් සාධක පිළිබඳව සොයා බැලීම වැදගත් වන අතර එමගින් සේවාව වෙත දැඩි විශ්වාසයකින් වින්දිතයා ප්‍රවේශ වීම තහවුරු වනු ඇත. පුද්ගල ආරක්ෂාව සම්බන්ධයෙන් ගත් කල වින්දිත ආරක්ෂාව මෙන්ම ඇයගේ සහයට ඉදිරිපත් වන පවුලේ සාමාජිකයින්, හිතවතුන් මෙන්ම සේවා සපයන්නන්ටද අපරාධකරු මෙන්ම ඔහුගේ පාර්ශවය නියෝජනය කරන විවිධ පුද්ගලයන් වෙතින් එල්ල විය හැකි තර්ජණ හා අභියෝග පිළිබඳ මනා අවධානයකින් පසු වීම සේවා සපයන්නාට පැවරෙන අභියෝගාත්මක කාර්‍යභාරයකි.

තවද, ආරක්ෂාව සැලසුම් කිරීමේදී සාක්ෂි නොනැසෙන පරිදි හා වින්දිතයාගේ රහස්‍යභාවයට හා පෞද්ගලිකත්වයට කිසිඳු හානියක් නොවන පරිදි එය සිදු කිරීමට වග බලා ගත යුතුය (උදාහරණ ලෙස; තාවකාලික නවාතැන් සැපයීම වැනි තත්වයන්හිදී).

# 5. සේවා සපයන්නකු විසින් "කලයුතු දේ" සහ "නොකල යුතු දේ"

## තොරතුරු, පෞද්ගලිකත්වය, රහස්‍යභාවය සහ ව්‍යතිරේකඃ

### තොරතුරු ලබාදීමඃ

වින්දිත සේවා සපයන්නෙකු ලෙස ඔබට කල හැකි තවත් වැදගත් කාර්‍යභාරයක් වන්නේ හිංසනයක් සම්බන්ධයෙන් පොලිසිය, රෝහල මෙන්ම වෙනත් සමාජ සේවා හා නඩු ක්‍රියාවලිය සමග සම්බන්ධ වීම පිණිස අවශ්‍ය තොරතුරු ලබා දීම හෝ වෙනත් පාර්ශවයක් හරහා අදාළ තොරතුරු සැපයීමට පහසුකාරීත්වය සැපයීමයි. මෙම තොරතුරු සැපයීමේදී ඔබට පුළුල් පරාසයක සම්පත් භාවිතා කිරීමට සිදුවනු ඇත. වින්දිතයා පසුවන තත්වය අනුව ඇතැම් වැදගත් තොරතුරු ක්ෂණිකව හා වාචිකව ලබා දීමට සිදුවනු ඇත. මෙම තොරතුරු ලබා දීමේදී ඉතා වැදගත් වන්නේ ඇයට අනවශය ලෙස අධික බර පැටවීම හා වගකීම් පැවරීම නොව අත්‍යාවශ්‍ය තොරතුරු ඉතා සැකෙවින් සරල භාෂාවෙන් ලබාදීමයි. එනම්, එහිදී පාරිභාෂිත යෙදුම්, කෙටි යෙදුම්, නීතිමය හෝ සංකීර්ණ භාෂාවන් යොදා නොතග යුතු අතර ඇයට අපැහැදිලි අවස්ථා වලදී නැවත නැවතත් විමසා කරුණු පැහැදිලි කර ගැනීමට ඉඩ සැලසීම, ඒවා ග්‍රහණය කර ගැනීම සඳහා හැකිතාක් කාලය ලබා දීම සහ එම තොරතුරු පිළිපැදීම පිළිබඳ ඇයගේ මතය විමසා සිටීමට තරම් ඔබ සංවේදී විය යුතුය.

### පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවයඃ

හිංසනයකට මුහුණ දුන් අයගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමේ දැඩි අවශ්‍යතාවය සේවා සපයන්නා විසින් ඇදහිය යුතු කාරණයකි. මෙහිදී ඉතාම වැදගත් කාරණයක් වන්නේ, වින්දිතයා තවදුරටත් හිංසනයට පත්වීම වළක්වා ගැනීමට උත්සුක වීමයි. මෙම අවශ්‍යතා දෙකම සමතුලිත කර ගැනීම තරමක් අභියෝගාත්මක කාරණයක් විය හැකි අතර යම් හෙයකින්, ඔබ අදාළ වින්දිතයාගේ තත්වය පිළිබඳව

වෙනත් පුද්ගලයෙක් හෝ පාර්ශවයක් සමග පැවසීමට අදහස් කරන්නේ නම් සැම විටම ඒ පිළිබඳ වින්දිතයාගේ අවසරය ලබා ගැනීම අතිශය වැදගත්ය (උදාහරණ ලෙස; පොලිසිය, වෙනත් සහය සේවා හෝ ඔබේ අධීක්ෂක). වින්දිතයා තුළ ඔබ මෙන්ම ඔබේ සේවාව පිළිබඳ ඇති වෘත්තීයමය විශ්වාසය උල්ලංඝනය නොවන බව ඉන් තහවුරු කරයි.

## රහස්‍යභාවයේ මූලික මූලධර්මයන් නොසලකා හැරීමට සිදුවන අවස්ථා (ව්‍යතිරේකයන්):

ඇතැම් තීරණාත්මක අවස්ථාවන්හිදී රහස්‍යභාවය පිළිබඳ  මූලික මූලධර්මයට වැදගත් ව්‍යතිරේක පවතී. යම් වින්දිතයෙක් ඔබට ලබා දෙන තොරතුරු වල රහස්‍යභාවය රැකීමට ඔබ අවංකවම අපොහොසත් විය හැක්කේ කුමන තත්වයන් යටතේද යන්න ඔබ ඇයට පැහැදිලි කර දීය යුතුමය. ඔබ හෝ ඔබේ ආයතනයේ අයෙක් අධිකරණයේදී වින්දිතයා වෙනුවෙන් සාක්ෂි සැපයීමට හෝ ඇය නියෝජනය කිරීමට ඉදිරිපත් වුවහොත් ඇය හෙළිදරව් කල ඇතැම් තොරතුරු අධිකරණය තුළදී අනාවරණය කිරීමට සිදුවනු ඇති බව ඇයට පහදන්න (උදාහරණ ලෙස; අපයෝජනයට ලක් විය හැකි දරුවකු පිළිබඳ තොරතුරු ලබා දී ඇත්නම් ඒ පිළිබඳව වාර්තා කිරීමට ඔබට වෘත්තීයමය බැඳීමක් ඇති බව).

## රහස්‍යභාවය පිළිබඳ මූලික මූලධර්ම:

- සේවාලාභී වින්දිතයින්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම යනු ඔබේ කාර්ය මණ්ඩලයේ සහ/හෝ  ඔබගේ ආයතනය නියෝජනය කරන ඕනෑම අයෙකුගේ මූලික වගකීමයි.
- සේවා සපයන්නන් මූලික වශයෙන් ඔවුන් සේවය කරන පුද්ගලයින්ට වගවිය යුතුය.
- සේවාලාභීන්ට තමන් ලබා ගන්නා සේවාවේ ස්වභාවය සහ එම සේවාවේ ඕනෑම ලේඛනයක අන්තර්ගතය පිළිබඳව දැන

ගැනීමට මෙන්ම ඔවුන් සපයා ඇති පුද්ගලික තොරතුරු වල යම් දෝෂයක් හෝ අතපසු වීමක් තිබේ නම් ඒවා නිවරදී කිරීමට ඉල්ලා සිටීමට අයිතියක් ඇත.

- සේවාලාභියා විසින් සේවාව ඉල්ලා සිටින අවස්ථාවේ රහස්‍යභාවයට ඇති සීමාවන් දැනුම් දීය යුතුය.

- සේවා සපයන්නන් ලබා ගත් තොරතුරු වල රහස්‍යභාවය වෘත්තීයමය වශයෙන් රකින අතර යම්හෙයකින් එවැනි තොරතුරු අනාවරණය කිරීමක් සිදුවන්නේ සේවාලාභියාගේ කැමැත්තෙන් හෝ එය අනාවරණය කිරීමට නීතිමය බැඳීමක් ඇති අවස්ථා වල පමණි.

- අවශ්‍යතාවය හා වගකීම් අනුව සේවා සපයන්නාට අනෙකුත් කාර්ය මණ්ඩලයට තොරතුරු අනාවරණය කල හැකි අතර එසේ තොරතුරු ලබා ගන්නා සෙසු කාර්ය මණ්ඩල සාමාජිකයින්ද ඒවායේ රහස්‍යභාවය පිළිබඳ සමව වග කිව යුතුය.

- වෙනත් මූලාශ්‍රයකින් තොරතුරු රැස් කිරීමට අවසර දී හෝ නියෝග කර ඇත්නම් මිස අදාළ පුද්ගලයාගෙන්ම තොරතුරු ලබා ගැනීම කල යුතුය.

## ''කල යුතු'' හා ''නොකල යුතු'' සහ පැවසිය යුතු දේ;

**පළමු හමුවීමේදී**

''කල යුතු''දේ;

✓ වින්දිතයාට ඔබ වෙත ළඟා වීමට ඉඩ දෙන්න. ඇයගේ අවශ්‍යතාවයන්ට සවන් දෙන්න

✓ මුලින්ම ඇයගේ මූලික අවශ්‍යතා වලට සහාය වන්නේ කෙසේදැයි විමසන්න. ඇතැම් වින්දිතයින්ට ක්ෂණික වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය වේ.

- ✓ ඔබගේ ස්ථානයේ ඔබ සමග කතා කිරීම පහසු බව ඇයට හැඟේ දැයි විමසන්න. ඇය සමග තවකෙකු සිටී නම් ඔහු/ඇය ඉදිරියේ ඇය සමග කතා කිරීම ආරක්ෂිත යැයි නොසිතන්න.
- ✓ බීමට ජලය, අත් පිස්නා සහ අසුන් ගැනීමට පහසු ස්ථානයක් වැනි ප්‍රායෝගික සහය සපයන්න
- ✓ සන්සුන්ව සවන් දෙන්න
- ✓ ඔබේ හැකියාව අනුව උපරිම සහය ලබා දීම මෙන්ම අවශ්‍ය නම් පරිවර්තකයෙකුගේ හෝ ඇය කැමති වෙනයම් අයෙකුගේ සහය ලබා දෙන්න

**''නොකල යුතු''දේ;**

- ✗ ඔබවෙත පිවිසි අය නරක, වැරදිසහගත හෝ අනවශ්‍ය දෙයක් සිදු කර හෝ හිංසනයක් අත්විඳ ඇත්තෙකු සේ සලකා මග නොහරින්න
- ✗ පීඩනයට පත් කිරීමෙන් හෝ බලහත්කාරයෙන් සහය සැලසීමට උත්සාහ නොකරන්න
- ✗ පමණ ඉක්මවා ප්‍රතිචාර දැක්වීමෙන් වළකින්න.
- ✗ ප්‍රති ප්‍රශ්ණ නැගීමෙන් වළකින්න
- ✗ වින්දිතයාට සුවපහසු සීමාව ඉක්මවා වැඩි තොරතුරු ලබා දෙන ලෙස බල නොකරන්න. සිදුව ඇති දේ සහ ඒ කා අතින්ද යන තොරතුරු වින්දිතයාට සවන් දීම සහ සේවා සැපයීමේ ඔබේ කාර්‍යභාරයට එතරම් අදාළ හෝ වැදගත් නොවේ.

**''පැවසිය යුතු''දේ පිළිබඳ උදාහරණ;**

- ''මට හිතේනෙ ඔබ ලොකු වේදනාවකින් ඉන්නව වගේ. ඔබට රෝහලකට හෝ සෞඛ්‍ය සායනයකට යන්න අවශ්‍යද?''

- ''ඔබට මෙම ස්ථානය පහසු යැයි සිතෙනවාද? අපට කතා කිරීමට මීට වඩා පහසු යැයි ඔබට හැඟෙන වෙනත් ස්ථානයක් තිබේද''
- ''ඔබට බීමට යමක් අවශ්‍යද? කරුණාකර ඉඳ ගන්න''
- ''මම/අපි ඔබට උදව් කිරීමට බැඳී සිටිනවා. ඒ නිසා මේ ඔබේම තැනක් යැයි සිතන්න''

**සවන් දීමේදී**

**''කල යුතු''දේ;**

✓ වින්දිතයා ලබාදෙන සෑම තොරතුරකම රහස්‍යභාවය සැලකිල්ලට ගන්න. වින්දිතයාට වඩාත්ම හොඳ සහය ලබා දෙන්නේ කෙසේදැයි පිළිබඳ ඔබට උපදෙස් හා මගපෙන්වීම් අවශ්‍ය නම් විශේෂඥයෙකු හෝ වෙනත් සගයෙකු සමග කතා කිරීමට වින්දිතයාගේ අවසරය පතන්න. වින්දිතයාගේ පෞද්ගලික අනන්‍යතාවය හෙළිදරව් නොකර එසේ කරන්නට වග බලා ගන්න.

✓ තත්වය හා අවස්ථාව අනුව අදාළ නම්, රහස්‍යභාවයේ සීමාවන් පිළිබඳ අපේක්ෂාවන් කළමනාකරණය කරගන්න

✓ ඔබේ කාර්යභාරයේ සීමාවන් පිළිබඳ සැලකිලිමත් වන්න

✓ ඔබ කතා කරනවාට වඩා සවන් දීමට කාලය ගන්න

✓ වින්දිතයා අස්වැසීමට සහ සුහදතාවය පළ කිරීමට අව්‍යාජ ප්‍රකාශයන් කිහිපයක් කරන්න. ඇයට සිදුව ඇති දේ ඇයගේ වරදක් නොවන බව අවධාරණය කරන්න

**''නොකල යුතු''දේ;**

✗ කිසිවක් සටහන් කර ගැනීම, ඡායාරූප ගැනීම, ඔබේ ජංගම දුරකථනයෙන් හෝ වෙනයම් උපකරණයකින් ඇයගේ කතාව පටිගත කිරීම හෝ මාධ්‍ය ඇතුළු වෙනත් පාර්ශවයන්ට දැනුම්

දීමෙන් වළකින්න (යම් හෙයකින් වින්දිතයා සමග කෙරෙන යම් සංවාදයක් පටිගත කිරීමක් හෝ ඡායාරූප ගැනීමක් අවශ්‍ය වන්නේ නම් එය වින්දිතයා දැනුවත්ව ලබා දෙන කැමැත්ත මත සිදුවිය යුතුය)

- ✗ සිදු වූ දේ පිළිබඳ ප්‍රශ්ණ කිරීමෙන් වළකින්න. ඒ වෙනුවට, හොඳින් සවන් දී ඔබට සහය වීමට කුමක් කල හැකි දැයි සුහදව විමසන්න
- ✗ වින්දිතයාගේ අත්දැකීම වෙනත් පුද්ගලයෙකුගේ පූර්ව අත්දැකීමක් සමග සැසඳීමක් නොකරන්න. තත්වය ''ලොකු දෙයක් නොවේ'' හෝ වැදගත් නොවන බව සන්නිවේදනය නොකරන්න. වැදගත්ම දෙය නම් වින්දිතයාට සිය අත්දැකීම පිළිබඳව හැඟෙන ආකාරයයි
- ✗ ඔබට පවසන දේ ගැන සැක පළ නොකරන්න. ඔබේ කාර්‍යභාරය වන්නේ පූර්ව විනිශ්චයකින් තොරව සවන් දීම සහ පවතින සේවාවන් හා ඔබට කල හැකිදේ පිළිබඳ තොරතුරු ලබා දීමයි

**''පැවසිය යුතු''දේ පිළිබඳ උදාහරණ;**

- ''මම ඔබට සහය වන්නේ කෙසේද?''
- ''අපි කතා කරන හැම දෙයක්ම අප අතරට පමණක් සීමා වෙනව. ඔබගේ අවසරයකින් තොරව මා කිසිවක් අනාවරණය කරන්නෙ නෑ''
- ''මට හැකි උපරිමයෙන් මම ඔබට උදව් වෙන්නම්. නමුත් මම උපදේශකයෙකු/විශේෂඥයෙකු නොවෙයි. ඔබට මට දීය හැකි ඕනෑම තොරතුරක් ලබා දීමට පුළුවන්''
- ''ඔබට සිදුවී ඇති දේ ගැන මට කණගාටුයි''
- ''ඒත්, එය ඔබගේ වරදක් නොවේ''

## සම්බන්ධතා ගොඩනැගීමේ දී

**''කල යුතු''දේ;**

- ✓ වින්දිතයාගේ ආත්ම විශ්වාසය තහවුරු කරමින් ස්වයං තීරණ ගැනීමට ඇති අයිතියට ගරු කරන්න
- ✓ ලබා ගත හැකි සියළුම සේවාවන් පිළිබඳ තොරතුරු ලබා දෙන්න
- ✓ වින්දිතයා කිසිඳු තීරණයක් ක්ෂණිකවම (දැන්ම) ගැනීම අවශ්‍ය නැති බවත් අනාගතයේ ඕනෑම විටෙක අදාළ සේවාවට ප්‍රවේශ වීම හෝ නොවීම පිළිබඳ තීරණය වෙනස් කල හැකි බවත් පැහැදිළි කරන්න
- ✓ වින්දිතයාගේ සහයට ඇයට විශ්වාස යමෙක්, මිතුරෙකු, පවුලේ අයෙකු හෝ රැකවලෙකු සිටී දැයි විමසන්න
- ✓ ඔබට ආරක්ෂිත යැයි හැඟේ නම්, ඔබගේ ජංගම දුරකථනය හෝ වෙනත් සන්නිවේදන උපකරණයක් ඇය විශ්වාස කරන අයෙකු හා සම්බන්ධ කර ගැනීමට සපයන්න
- ✓ සෑම ක්‍රියාමාර්ගයක්ම ගැනීමට පෙර වින්දිකයාගේ අවසරය හා කැමැත්ත විමසන්න.

**''නොකල යුතු''දේ;**

- ✗ ඔබේ හැකියාවන් පිළිබඳ අතිශයෝක්ති හෝ ඔබට කල නොහැකි දේ පිළිබඳ පොරොන්දු වීම් හෝ ව්‍යාජ තොරතුරු ලබා නොදෙන්න
- ✗ හොඳම ක්‍රියාමාර්ගය හෝ ඊළඟ පියවර පිළිබඳ ඔබේම උපදෙස් හෝ මතයන් ඉදිරිපත් නොකරන්න
- ✗ ඇයට අවශ්‍ය දේ ඔබ දන්නා බව නොසිතන්න. ඇතැම් ක්‍රියා නිසා කෙනෙකුට තවත් අපකීර්තියක්, පළිගැනීමක් හෝ හානියක් වන්නට පුළුවන

✗ යමෙකු හෝ ඔවුන්ගේ අත්දැකීම් ගැන උපකල්පන නොකරන්න. වයස,විවාහක/අවිවාහක බව, ආබාධ සහිත බව, ආගම, ජනවාර්ගිකත්වය, පංතිය, ලිංගික දිශානතිය, ස්ත්‍රී පුරුෂ භාවය, අපරාධ කරගේ අනන්‍යතාවය ආදී කිසිඳු හේතුවක් නිසා වෙනස්කොට නොසලකන්න

**''පැවසිය යුතු''දේ පිළිබඳ උදාහරණ;**

- ''අපගේ සංවාදය අප අතර පමණක් පවතිනු ඇත''
- ''මම උපදේශකයෙකු/විශේෂඥයෙකු නොවේ. වමුත් මා දන්නා තොරතුරු මට ඔබට ලබා දෙන්නට පුළුවන්. ඔබට යම් අමතර සහයක් දීය හැකි සේවාවන් ගැන මම කියා දෙන්නම්. ඔබ ඔවුන් ගැන දැන ගැනීමට කැමතිද?''
- ''සේවාව පවතින ස්ථාන/ය, සේවාව විවෘතව පවතින කාලසීමාවන්, පිරිවැය (අදාළ නම්), ප්‍රවාහණ විකල්ප සහ ඔබ හමුවිය යුතු අයගේ නම ඇතුළු තොරතුරු මෙහි තියෙනවා''
- ''ඔබට සිදුවී ඇති දේ නිසා ඔබ ඔබේ ආත්ම විශ්වාසය අඩු කරගෙන නැති බව පේනවා. ඒ ගැන මට හරිම සතුටුයි. ඒක ගොඩක් ධණාත්මක තත්වයක් වගේම ඒ හේතුවෙන් මට ඔබට උදව් වීමත් පහසු වෙනව''

# 6. වින්දිතයෙකුගේ දෘෂ්ඨිකෝණය

## සහය පැතීමේ ප්‍රතිලාභ සහ අවදානම්:

වින්දතයෙකු සහය සේවා පැතීම සැමවිටම ආරක්ෂිත නොවන අතර ඉන් නොසිතූ නොපැතූ හානීන් ගෙන දීය හැක.සේවා සපයන්නෙකු ලෙස ඔබගේ ප්‍රශස්ත කාර්‍යභාරය වන්නේ පවතින සෙවාවන් පිළිබඳ නිවැරදි, යාවත්කාලීන තොරතුරු සැපයීම මෙන්ම සහය සේවා වල උපකාර පැතීමෙන් වින්දිතයාට ඇති ප්‍රතිලාභ මෙන්ම අවදානම් පිළිබඳවද ඔවුන්ට පහදා දීමයි.

සහය සේවා  පැතීමේ ප්‍රතිලාභ සහ අවදානම් පිළිබඳ උදාහරණ කිහිපයක් පහත සඳහන් වේ;

## සහය පැතීමේ ප්‍රතිලාභ;

- වින්දිතයාගේ ජීවිතාරක්ෂක ආධාර සඳහා ප්‍රවේශය ලැබීම.
- එච්.අයි.වී. ආසාදන හෝ අනවශ්‍ය ලැබ් ගැනීම් වැනි තත්වයන් වළක්වා ගැනීමට අවශ්‍ය කාලෝචිත, ආරක්ෂිත, රහස්‍යභාවයෙන් යුත් හා වෘත්තීය වෛද්‍ය ප්‍රතිකාරමය සහය සඳහා ප්‍රවේශය ලැබීම.
- ආරක්ෂාව සහ මනෝ-සමාජීය සහය පිණිස වන විකල්ප ඇතුළු වඩා අභිමානවත් සුවපහසු සේවාවන් වෙත ප්‍රවේශය.
- තවදුරටත් හිංසනයට පත් වීම වළක්වා ගැනීමට සුදුසු ආධාරක ප්‍රවේශය ලබා ගැනීම
- සාක්ෂි, තොරතුරු සහ වින්දිත අත්දැකීම පිළිබඳ නිසි හා ක්‍රමවත් වාර්තාකරණ ක්‍රියාවලියක් පවත්වා ගෙන යාමට හැකි වීම.

## සහය පැතීමේ අවදානම්;

- වින්දිතයාගේ මිතුරන්, පවුලේ උදවිය සහ ප්‍රජාව අදාළ සිද්ධිය සහ ක්‍රියාවලිය පිළිබඳ දැන ගන්නා අතර ඉන් අපකීර්තියට පත් වීමට ඉඩ ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස නිවසින් බැහැර කිරීම, ප්‍රජාව තුල හුදකකලා කිරීම මෙන්ම එමගින් වඩා වැඩි අවදානම්පාත්‍රීභාවයකට පත් විය හැක.
- තමා සහ තමාගේ වරදකාරී ක්‍රියාව පිළිබඳ අන් අය දැන ගත් බව අපරාධකරු අවබෝධ කර ගැනීමෙන් ඔහු හෝ ඔහුගේ ආධාරකරුවන් විසින් වින්දිතයාට සහ/හෝ පවුලේ අයට විවිධ හානි ඇති කිරීම හෝ ආදාළ තත්වයන් මත ඇතැම්විට විට වින්දිතයා මරණයට පත් කිරීමෙන් පවා පළිගැනීමට ඉඩ ඇත.

- වින්දිතයාට උපකාර කරන බව වැටහීමෙන් සේවා සපයන්නන්ට අපරාධකරුගෙන් තර්ජන ඇති වන්නටද පුළුවන.

- සේවා සපයන්නන් නිසි පුහුණුව නොලත් අය වුවහොත් අසංවේදී ප්‍රතිචාරයන් දැක්වීම සහ/හෝ වරදී උපදේශනයන් සැපයිය හැකි වීම.

## වින්දිතයා පිළිබඳ සහකම්පාවෙන් මැදිහත් වීම:

**පළමු හමුවීමේදී:**

කාන්තාවකට එරෙහි යම් හිංසනයක් පිළිබඳ අත්දැකීමක් ඔබට හෙළි කල විට,

- ඉතා සුහදව ඇයව පිළිගන්න

- ඇය කරදරයකට පත්ව ඇති බව ඔබට හැඟුනද,ඇයට කිසිම වෙනසක් නොහඟවන්නට වග බලා ගන්න

- ඔබේ නම, තනතුර/භූමිකාව සහ ආයතනය පිළිබඳ සුහද හැඳින්වීමක් කරන්න (මෙය අදාළ තැනැත්තියගේ මානසික කැළඹිලි ස්වභාවය සහ සේවාව හෝ තත්වය හෙළි කිරීම පිළිබඳ ඇය තුළ පවතින නුහුරු බව පහ කිරීමට යොදා ගත හැක)

- ''ඔබට මගෙන්/අපෙන් අවශ්‍ය උදව්ව මොකද්ද?'' වැනි සුහද විමසීමක් කරන්න

**ක්ෂණික මූලික අවශ්‍යතා සැපිරීම:**

- සෑම පුද්ගලයෙකුටම විවිධ මූලික අවශ්‍යතා ඇත. ඒවාට ක්ෂණික වෛද්‍ය ප්‍රතිකාර, පිපාසය හෝ කුසගින්න සන්සිඳවීම, සිය ආදරණීයයෙකුගේ සහය පැතීම හෝ ඇඳුම් ඉරා දැමීමක්, අපිරිසිදු වීමක් වී ඇත්නම් (සාක්ෂි වලට හානි නොවන පරිදි) සුදුසු පියවර ගැනීම. මෙමගින් වින්දිතයාට වඩා සුවපහසු හා ගෞරවනීය හැඟීමක් ඇති කර ගැනීමේ මූලික අවශ්‍යතාවය සපුරා ගත හැක.

- වින්දිතයාට සිය පුද්ගලික ආරක්ෂාව පිළිබඳ හැඟෙන්නේ කෙසේ දැයි පවසන්නට ඉඩ දෙන්න. ඔබ දකින දේ මත පදනම්ව උපකල්පනයන්ට නොඑළැඹීමට වගබලා ගන්න.

- ඔබ හා වින්දිතයා අතර සාකච්ඡාව අතරට වෙනත් කිසිඳු අයෙක් කැඳවීමෙන් වළකින්න.

- තමා කැමති ඕනෑම ආකාරයකින් සිය හැඟීම් ප්‍රකාශ කරන්නට ඉඩ දෙන්න. ආතතිය හා මානසික වික්ෂිප්තභාවය අනුව වින්දිතයින් විවිධ හැසිරීම් සහ ප්‍රතිචාරයන් දක්වනු ඇත. ඇතැමුන් සිය හඬ අවධි කර ගැනීමට අපසුවෙන් හෝ හැඬීම් බර වීම නිසා නිහඬතාවය රකිනු ඇත. නොඑසේනම්, කෝපයෙන් කෑ ගැසීමට හෝ සිදුව ඇති දේ ගැන තමාටම දොස් පවරා ගනිමින් නොසන්සුන්ව හැසිරෙනු ඇත. මෙම සියළු තත්වයන්ට සංවේදීව ප්‍රතිචාර දක්වන්න.

- ආබාධ සහිත (විශේෂ අවශ්‍යතා සහිත) පුද්ගලයින් හස්ත මුද්‍රාවෙන් කතා කරන විට හෝ වෙනත් භාෂාවකින් කතා කරන අය පැමිණි විට යම් බාධක ඇති වනු ඇත. එවන් අයට සවන් දීමට නිසි සහය ලබා ගැනීමේ දී වින්දිතයා කේන්ද්‍ර කරගත් මූලධර්ම හා රහස්‍යභාවය පිළිබඳ තත්වයන් පිළිපදින්න.

- යම්හෙයකින් ඔබට යමෙකු වටහා ගැනීමට අපහසු වුවද, ඒබ ව ඇයට නොහඟවන්න. දිගටම ඔබේ සහයෝගය ලබා දෙන්න.

- විශේෂයෙන්ම කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට සංස්කෘතිකමය වශයෙන් පිරිමින් සමග අන්තර්ක්‍රියා කිරීමට නොහැකි අවස්ථා වලදී සහය ලබා දීම පිණිස පුහුණු කාන්තා කාර්‍ය මණ්ඩලයක් /නිළධාරිනියක් ඇති බව තහවුරු කරන්න.

**සවන් දීමේදී:**

වින්දිතයාගේ මූලික අවශ්‍යතා සැපිරීමෙන් පසුව ඇයට ආසන්න අවදානමක් නොමැති බව සහතික කර ගැනීමෙන් පසුව,

- වින්දිතයා ඉතා කලබලකාරී සහ/හෝ ව්‍යාකූල තත්වයක් පෙන්නුම් කල හැකි වුවද, සහයකයෙකු ඔබ ලෙස හැකිතාක් සන්සුන් වීම ඉතා වැදගත්ය. වින්දිතයාට හැකි තරම් තොරතුරු පැවසීමට ඉඩ සලසන්න. එය වින්දිතයාගේ ආතතිය මුදා හැරීමට මහගු සහයක් වේ. උපදේශනය සැපයීම, වෙනත් සේවා වෙත රැගෙන යාම හෝ යොමු කිරීම මෙන්ම සිදුව ඇති දේ පිළිබඳ සවිස්තරාත්මක සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම මෙහිදී ඔබේ කාර්යභාරය නොවන බව සිහි තබා ගන්න.

- සිදුව ඇති දේ පිළිබඳ සවිස්තරාත්මක ප්‍රශ්ණ ඇසීම වෙනුවට වින්දිතයාට ලබා ගත හැකි සේවාවන් පිළිබඳ තොරතුරු සැපයීම කෙරෙහි අවධානය යොමු කරන්න.

  *උදාහරණ: සාමාන්‍යයෙන් ප්‍රශ්ණ ඇසීම මගහැරීම වඩාත් සුදුසු වන අතර විශේෂයෙන් ''ඇයි'' යන වචනයෙන් ඇරඹෙන ප්‍රශ්ණ වලින් වින්දිතයාට දොස් පැවරෙන බවක් හැඟීමට වඩාත් ඉඩ ඇති හෙයින් ඒ වෙනුවට ''ඔබට අවශ්‍ය මොන වගේ උදව්වක්ද? '' වැනි දේ විමසීම වඩා සුදුසුය.*

## සවන් දීමේ බලයඃ

ඇතැම්විට ඔබ කිසිඳු සේවාවක් හෝ උපකාරයක් වින්දිතයෙකුට ලබා දීමට නොහැකි තත්වයක සිටිනවා විය හැක (උදාහරණ ලෙස; ඇඳිරි නීති තත්වයන් සහ දුරකථන විසන්දිවීම් හෝ රට තුල කැළඹිලිකාරී තත්වයන්). එවැනි අවස්ථාවකදී ඔබට යම් අසරණ බවක් දැනෙන්නට පුළුවන. එහෙත් ඔබ වින්දිතයා සමග අවංක හා අව්‍යාජ සබඳතාවය ගොඩනගා ගැනීම වැදගත්ය. වින්දිතයා සිය අත්දැකීම පිළිබඳව ඔබට හෙළි කිරීමට ඇයට ඇති ධෛර්‍යය හඳුනා ගැනීම, ඔබේ සංවේදීතාවය සහ ඇය කෙරෙහි ඔබ තුළ පවතින ගෞරවය ඇයට හැඟවීම යනාදීය සඳහා සන්සුන් සවන් දීම අතිශය වැදගත් වේ.

### සම්බන්ධතා ගොඩනැගීමේ දී:

වින්දිතයාගේ ඊළඟ පියවර පිළිබඳ තීරණ ගැනීමට සහය දීමත් සමගම...,

- වින්දිතයාගේ සහයට ඇය සමග සිටීමට හා අවශ්‍ය තැන් වෙත යාමට විශ්වාසනීය අයෙක් ඇත් දැයි විමසන්න.
- ඔබේ අදහස විමසුවොත්, යා යුත්තේ හෝ සම්බන්ධ කර ගත යුත්තේ කවුරුන්ද?, කවදාද?/කෙබඳු අවස්ථාවන්හිදීද? සහ ඒ ඇයිද? යන කාරණා පිළිබඳ තමාගේම තීරණ ගැනීමට දිරි ගන්වන්න.
- තත්වය පිළිබඳ ඔබේ මතයන් ඉදිරිපත් කිරීමෙන් වළකින්න
- ලබා ගත හැකි සේවාවන් සහ ඒවාට ප්‍රවේශ විය හැකි පහසුම ආකාරය පිළිබඳ නිවැරදි සහ යාවත්කාලීන තොරතුරු ඔබ සතුව ඇති බවට වග බලා ගන්න.
- වින්දිතයා ගත් යම් තීරණ කෙරෙහි ධණාත්මක ප්‍රතිචාර දක්වා තවතවත් දිරිමත් කරන්න.

## 7. සේවාදායක ඔබේ ආරක්ෂාව පිළිබඳ අවධානය

හිංසනයෙන් වින්දිතභාවයට පත් අයට සේවා සපයන සියළුම වගකියව යුතු ආයතන සහ පුද්ගලයින් සිය ආරක්ෂාව පිළිබඳ ඉහළ ප්‍රමුඛතාවයක් ලබාදීය යුතුය. අර්බුදයක පසුවන කාන්තාවන්ට ප්‍රතිචාර දක්වන කාර්‍ය මණ්ඩලයේ ආරක්ෂාව පිණිස නිසි ක්‍රියාමාර්ග පිළිපැදීම ඉතා වැදගත්ය. විශේෂයෙන්ම කාර්‍යාලය තුළත් ඉන් පිටතත් කටයුතු කිරීමේදී ඔබට වින්දිතයින්ගේ බිය හා භීතිය, ප්‍රකෝපශීලී ඇමතුම්, වෛරය, වේදනාව, ලේ වැගිරීම් සහිත දරුණු තුවාල, දරුණු ආතති තත්වයන් මත උමතුව හැසිරීම් මෙන්ම නොසන්සුන් ප්‍රතිචාරයන් අත්විඳීමට සිදුවනු ඇත. එවැනි ලිංගික අතවරයකට ලක් වූ හෝ ප්‍රකෝපකාරී

පහරදීමකට ලක් වූ හෝ දැඩි නොසන්සුන්කාරී ප්‍රතිචාරයන් දක්වන වින්දිතයෙකු සමග කටයුතු කිරීමට සිදු වීමකදී ඊට මුහුණ දීය යුත්තේ කෙසේද?, අර්බුදකාරී ඇමතුම් වලට ප්‍රතිචාර දැක්වීම, වින්දිතයෙකුගේ ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීමක් සඳහා  පිටතට යායුත්තේ කෙසේද?, කාසමගද?මෙන්ම එසේ නොයා යුත්තේ කුමන අවස්ථාවන්හිදී ද? සහ ඒ ඇයි? යනාදී කරුණු පිළිබඳ මෙන්ම ඊට යෙදීය හැකි විකල්පයන් පිළිබඳ පැහැදිලි මාර්ගෝපදේශ තිබිය යුතුය. සේවක ආරක්‍ෂාව පිණිස මාර්ගෝපදේශ තිබීම ඉතා වැදගත් වන්නේ ඒ නිසාමය. එබැවින් ඒ පිළිබඳ ඔබේ ආයතනයේ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි පිළිබඳ මනා දැනුවත්භාවයකින් කටයුතු කරන්න.

## පහත සඳහන් පොදු ආරක්‍ෂක මාර්ගෝපදේශයන් මතක තබා ගන්න;

- නොවැළැක්විය හැකි හේතුවක් මත හෝ පිටතට ගොස් තොරතුරු ලබා ගැනීම හෝ සැපයීමට සිදුවන සෑම අවස්ථාවකදීම තවකෙකු කැටුව යන්න.
- එසේ යාමේදී ඔබ ආයතනයේ හෝ වෙනත් සමීපතමයෙකු දැනුවත් කර යන්න (වින්දිත අනන්‍යතාවය හෙළි කෙරෙන හෝ රහස්‍යභාවයට හානි නොවන පරිදි)
- පොලිසියේ අනුදැනුම හා නියෝජනය නොමැතිව කිසිඳු අපරාධ ස්ථානයකට කිසිම හේතුවක් නිසා පිවිසීමෙන් වළකින්න.
- අර්බුදකාරී ඇමතුම් වලට ප්‍රතිචාර දැක්වීමේදී පොලිසියේ සහය ලබා ගන්න (උදාහරණ ලෙස; අපරාධකරු හෝ එම පාර්ශවයෙන් කෙරෙන තර්ජනාත්මක ඇමතුම්)
- ඔබපොලිසිය සමග හෝ යම් අපරාධ ස්ථානයකට යයි නම්, සැම විටම ඔබ යන ස්ථානය, දුරකථන අංකය සහ ඔබ නැවත පැමිණීමට අපේක්ෂා කරන වෙලාව පිළිබඳ ඔබේ ආයතනයට දැනුම් දී යාමට සිහි තබා ගන්න.

- වින්දිතයාගේ බඩුබාහිරාදිය රැගෙන ඒමට කිසිසේත් මැදිහත් නොවන්න. ඒ සඳහා පහසුම හා ආරක්ෂිතම ක්‍රමය ගැන තීරණය කිරීමට වින්දිතයා දිරිමත් කරන්න (පවුලේ සාමාජිකයින්, හිතවතුන්, ග්‍රාම සේවක හෝ පොලිසියේ සහයපැතීම වැනි)
- ඔබේ සහජ බුද්ධිය ස්ථානෝචිත ප්‍රඥාව පිළිබඳව නිරතුරු විශ්වාසය තබා ගන්න.

## සීමාවන් තීරණය කිරීම:

විශේෂයෙන් ලිංගික හිංසනයන්ට පත් වින්දිතයින්ට සේවා සැපයීමේදී ඔබ අතිශය සංවේදී වීමේ හේතුවෙන් ඇතැම් විට ඔබේ සේවාවන් සඳහා සීමාවන් පනවා ගැනිමට අකමැති විය හැකි මුත් ඔබ ඒසේ කල යුතුය. පුද්ගලික සීමා සකසා ගැනීම මගින් වින්දිතයාට ද සිය ජීවිත තුළ එසේ සීමා අනුගමනය කල හැකි ආකාරය පෙන්වා දීය හැක. සේවා සපයන්නාගේ භූමිකාවේ සීමාවන්ට ගරු කිරීමෙන් වින්දිතයාගේ ස්වාධීනත්වය සහ ස්වයං-පාලනය පිළිබඳ හැඟීම වර්ධනය වනු ඇත. ඔබේ කාර්යභාරයේ නියම සීමාවන් වටහා ගැනීමට සහ නිර්වචනය කිරීම පිණිස ඔබේ ආයතනය ඔබ වෙත සපයා ඇති රැකියා විස්තරය පිළිපැදීම හොඳම ක්‍රමය වන අතර සේවාවක් සැපයීම සඳහා යොමු වන සෑම විටකම පහත සඳහන් කාරණා පිළිබඳ ස්වයං-විග්‍රහයක යෙදෙන්න;

- ඔබ කරන්නේ කුමන ආකාරයේ මැදිහත් වීමක්ද?
- ඔබගේ කාර්යසාධනය වාර්තා කල යුත්තේ (ඔබගේ ප්‍රධානියා/ප්‍රධානීන් කවුරුන්ද?) කාටද?
- ඔබ එසේ වාර්තා කල යුත්තේ ඇයි?
- ඔබට සහය දීමට ඇති සෙසු සේවකයින් කවුරුන්ද?
- එසේ ඔබ සෙසු සේවක සහය ලබා ගත යුත්තේ ඇයි?
- ඔබ ඔබේ දුරකථන අංකය, නම හා තනතුර හෙළිදරව් කල යුත්තේ හා එසේ නොකල යුත්තේ කාටද? සහ ඒ කුමන අවස්ථාවලදීද? මෙන්ම ඒ ඇයි?

- වින්දිතයින්ට සේවා සැපයීමේ දී පෞද්ගලික මට්ටමෙන් සබඳතා ගොඩනගා නොගැනීමට වග බලා ගත යුත්තේ ඇයි? (වින්දිතයාගේ හෝ ඔබේ නිවසේදී හෝ වෙනයම් පෞද්ගලික ස්ථාන වලදී හමුවීම, නිසසේදී පවා නිතර දුරකථන සංවාදයන් පැවැත්වීමට හුරුවීම සහ වින්දිතයා වෙනුවෙන් ලිපි ලිවීම, සාක්ෂි නිර්මාණය, රැස් කිරීම හෝ එවැන්නකට සහය දීමආදියට මැදිහත් වීමෙන් වැළකීම)
- ඔබගේ පුද්ගලික වාහනයෙන් වින්දිතයාට ප්‍රවාහන පහසුකම් සැපයීමට හෝ වින්දිතයාගේ පුද්ගලික වාහනයෙන් ඔබේ ප්‍රවාහන අවශ්‍යතා ඉටු කර ගැනීමට ඉදිරිපත් නොවිය යුත්තේ ඇයි?

# 8. සේවා සපයන්නන් අතර සම්බන්ධීකරණය

## සම්බන්ධීකරණය සහ සම්බන්ධීකරණ පාලනය

කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහි හිංසනයට ප්‍රතිචාර දැක්වීමේදී, සහකරු හිංසන සහ සහකරු නොවන හිංසන වල වින්දිතයින් සහ අගතියට පත් වූවන් තව දුරටත් පීඩාවට පත්වීමෙන් ආරක්ෂා කිරීම පිණිස සාමූහික බහුවිධ-විනය ක්‍රියාමාර්ග වලින් හෙබි අන්තර් නියෝජිත ප්‍රවේශයක් අත්‍යාවශ්‍යය. හුදකලාව වැඩ කරන ආයතන වලට වඩා මනාව සම්බන්ධීකරණය වූ පද්ධතීන් හරහා ක්‍රියාත්මක වීමෙන් හිංසනයට ප්‍රතිචාර දැක්වීම කෙරෙහි වැඩි බලපෑමක් මෙන්ම වඩා හොඳ කාර්යක්ෂමතාවයක්ද ඇති කරයි. අත්‍යාවශ්‍ය සේවා සම්බන්ධීකරණය සහ සම්බන්ධීකරණ පාලනය සඳහාවන මෙම මාර්ගෝපදේශයන් එම සම්බන්ධීකරණ ප්‍රවේශයේ ප්‍රතිලාභ සහතික කිරීමද අරමුණු කර ගනී.

**සම්බන්ධීකරණය** යනු කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට එරෙහි හිංසනය කෙරෙහි ප්‍රතිචාර දැක්වීමේ කේන්ද්‍රීය අංගයකි. එය කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට එරෙහි හිංසනය කෙරෙහි ප්‍රතිචාර දැක්වීම පුළුල්, බහුවිද විනයන් සහිතව, මනාව සම්බන්ධීකරණය

වූ, විධිමත් හා තිරසාර එකක් බව සහතික කිරීම ඉලක්ක කරගත් අන්තර්ජාතික ප්‍රමිතීන් මගින් ඉස්මතු වූ අවශ්‍යතාවයකි. එය නීතීන් හා ප්‍රතිපත්තීන් මගින් පාලනය වන ක්‍රියාවලියකි. එය කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට එරෙහි හිංසනයන් වැලැක්වීම හා ප්‍රතිචාර දැක්වීම පිණිස වන නීතීන්, ප්‍රතිපත්තීන්, කෙටුම්පත් සහ ගිවිසුම් මෙන්ම සන්නිවේදනයන් සහ සහයෝගීතාවයන් ක්‍රියාත්මක කිරීම සඳහා අදාල සියලු ආංශික මැදිහත්වීම් කරන කණ්ඩායම්, පුද්ගලයින් සහ ආයතනයන් විසින් දරණ සාමූහික ප්‍රයත්නයක් හා සම්බන්ධ වේ. සම්බන්ධීකරණය හිංසනය ආමන්ත්‍රණය කිරීම තුල ජාතික තලයේ භූමිකාවන් ක්‍රියාත්මක කරන අමාත්‍යාංශ තුලත්, ප්‍රාදේශිය තලයේ සේවා සපයන්නන් සහ හවුල්කරුවන් අතරත් මෙන්ම ඇතැම් රටවල ජාතික හා ප්‍රාදේශීය තල වල රජයන්හි අතරමැදි මට්මම් අතරත් දැකිය හැක. රජයන්හි විවිධ මට්ටම් අතරද සම්බන්ධීකරණයන් දැක ගත හැක.

**සම්බන්ධීකරණය** පාලනය ප්‍රධාන අංග දෙකකින් සමන්විතය. පළමු අංගය වන්නේ කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට එරෙහි හිංසනයන් තුරන් කිරීම හා ඒවාට ප්‍රතිචාර දැක්වීම පිණිස වන අත්‍යාවශ්‍ය සේවා ක්‍රියාත්මක කිරීම සහ ඒවා සම්බන්ධීකරණයට සහය දීම සඳහා අවශ්‍ය නීති සහ ප්‍රතිපත්ති සම්පාදනයයි. දෙවැනි අංගය වන්නේ කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට එරෙහි හිංසනයන් කෙරෙහි සහ පවතින දුර්වලතාවයන් පිළිබඳ සාමූහික ප්‍රතිචාරයන් කෙරෙහි බැඳීමකින් යුතුව කටයුතු කරන අනෙකුත් පාර්ශවකරුවන්ගේ වගවීම දැරීමේ මෙන්ම එම සාමූහික ප්‍රතිචාරයන්හි අධීක්ෂණ හා ඇගයුම් ක්‍රියාවලියයි. එය පාලනය කිරීම ජාතික සහ ප්‍රාදේශීය තල දෙකෙහිදීම සිදුවේ.

## සම්බන්ධීකරණයේ සහ පාලනයේ ඇති වැදගත්කම

සම්බන්ධීකරණය සහ පාලනය යනු අදාල සියලු අංශයන් අතර නිරන්තර දැනුවත් වීම් මෙන්ම අන්‍යෝන්‍ය වශයෙන් දායකත්වය සපයයන එකිනෙකට බැඳී පවතින කාර්‍යයන් දෙකකි. සම්බන්ධීකරණය නිති සහ ප්‍රතිපත්තීන්ගෙන් පාලනය වන විධිමත් හෝ අවිධිමත් ක්‍රියාවලියක්

විය හැකිය. කෙසේ වෙතත්, නිති සහ ප්‍රතිපත්ති පදනම් විය යුතුතේ ජාත්‍යාන්තර ප්‍රමිතීන් මා සම්මතයන්, සාක්ෂි සහ සම්බන්ධීකරණය පිළිබඳ ඍජු අත්දැකීම් තුලින් උගත් පාඩම් උපයෝගී කර ගනිමින් සකසන ලද වඩාත්ම හොඳ භාවිතයන් මතය. පාලනයේ වගවීමේ ක්‍රියාකාරීත්වයන් මගින් සම්බන්ධීකරණයේ ශක්තීන් සහ දුර්වලතා හඳුනාගෙන නීති, ප්‍රතිපත්ති සහ භාවිතයන් වැඩිදියුණු කෙරෙන වෙනස්කම් කෙරෙහි මග පෙන්විය යුතුය.

සම්බන්ධීකරණ ප්‍රතිචාරයන් වැදගත් වනනේ එය වින්දිතයින් සහ අගතියට පත් අය හිංසනයෙන් ආරක්ෂා කර ගැනීම සහ වැරදිකරුවන් වගවීම සඳහා වඩා ඵළදායී වන නිසා මෙන්ම සමාජයේ විවිධ අංශ හුදකලාව මෙම ගැටළුව ආමන්ත්‍රණය කරන නිසාය.

සම්බන්ධීකරණ මගින් වින්දිතයින් සහ අගතියට පත් අයට, කාන්තාවන්ට එරෙහි හිංසනයන්ට ප්‍රතිචාර දක්වන ආයතනයන්ට සහ නියෝජිතයින්ට මෙන්ම ප්‍රජාවන්ට ද ප්‍රතිලාභ ගෙන දෙයි.

සම්බන්ධීකරණ ප්‍රතිචාර මගින් ඕනෑම මැදිහත්වීමක් සහ ආයතණික ප්‍රතිචාරයක් වින්දිතයින් සහ අගතියට පත් අය කේන්ද්‍ර කර ගැනීමෙන් ඔවුන්ගේ ආරක්ෂාව වැඩි වනු ඇත. සම්බන්ධීකරණය වූ ප්‍රතිචාරයක් මගින් වින්දිතයින් සහ අගතියට පත් අයට කැපවීමෙන් යුත් සහායක පරිසරයක් තුල දැනුවත් හා කුසලතා සහිත මෙන්ම දැනුම හුවමාරු කර ගන්නා වෘත්තිකයින් වෙත ප්‍රවේශය ලබා දේ. සම්බන්ධීකරණය වූ ප්‍රතිචාරයකට සමපාත සේවා සහ යොමු කිරීම් ජාල හරහා සැපිරිය හැකි වින්දිතයින් සහ අගතියට පත් අයගේ බහුවිධ අවශ්‍යතාවයන් හඳුනා ගැනීමට හැක. ආයතන අතර තොරතුරු හුවමාරු කර ගැනීමෙන් වින්දිතයින් සහ අගතියට පත් අයට සිය කතාව පැවසීමට සිදුවන වාර ගණන අඩු කල හැකි අතර ඉන් ඔවුන් ප්‍රති-කම්පණයට පත්වීමේ අවදානම ද අඩු කරයි. ඒකාබද්ධ සත්කාර මොඩියුල වලින් අදහස් වන්නේ වින්දිතයින් සහ අගතියට පත් අයගේ මනෝ-සමාජීය, ලිංගික සෞඛ්‍ය සහ වෙනත් සෞඛ්‍ය අවශ්‍යතා පූර්ණ ලෙස ආමන්ත්‍රණයට ඇති ඉඩ කඩ වැඩි බවයි. මීට අමතරව, කාන්තාවන්ට

සහ ගැහැණු ළමුන්ට එරෙහි හිංසනයන්ට අනාගතයේදී මුහුණ දීමට ඇති අවදානම අවම කිරීම මෙන්ම එවැනි සිදුවීමක් ඇති වූ විට වහා එම ස්ථානයෙන් ඉවත් වීම සඳහා වන හැකියාව වැඩිදියුණු කෙරෙන මූල්‍ය හා සමාජීය ස්වෛරීත්වය ඇති කිරීම පිණිස වන කාන්තා අයිතීන් ඊට ඒකාබද්ධ කල හැක.

සම්බන්ධීකරණ ප්‍රතිචාරයක් මගින් කාන්තාවන්ට එරෙහි හිංසනයන්ට ප්‍රතිචාර දක්වන ආයතනයන්ට සහ නියෝජිතයින්ට ද ප්‍රතිලාභ ලැබෙන අතර එමගින් ඒවා වඩා ඵලදායී කරයි. අවම වශයෙන් පවත්වා ගත යුතු ප්‍රමිතීන්ට අනුකූල වීමෙන් හවුල්කාර ආයතන වලට වඩා ස්ථාවර ප්‍රතිචාර දැක්විය හැක. භූමිකා සහ වගකීම් පිළිබඳ පැහැදිලිතාවය යන්නෙන් අදහස් කෙරෙන්නේ එක් එක් අංශයට සිය විශේෂඥතාවයන් වඩා තීව්‍ර කර ගත හැකි අතර එක් එක් වෘත්තිකයාගේ කාර්යයන්හි යම් ඌනතාවයන් වෙතොත් අනෙකුත් ආයතන සහ වෘත්තිකයින් විසින් ඒවා සපුරනු ඇති බවයි. වෙනත් අංශ සමග සම්බන්ධීකරණය කිරීම අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියට අපරාධකරුවන් වගවීම පිණිස වන හැකියාව වැඩි කරයි. ලිඛිත හවුල් ගිවිසුම් හා එකඟතා මගින් නියෝජිත ආයතන අතර පැහැදිලි හා විනිවිදභාවයකින් යුතු සන්නිවේදනයක් සහ වගවීමේ යාන්ත්‍රණයක් සහතික කෙරේ. සම්බන්ධීකරණය යනු වින්දිතයින් සහ අගතියට පත් අයට, අපරාධකරුවන්ට සහ ප්‍රජාවන්ට නිශ්චිත පණිවුඩ ලබා දීමට සහ ප්‍රතිචාර දැක්වීමට හැකි බවයි. අඛණ්ඩව කෙරෙන අවදානම් තක්සේරුකරණයේ ප්‍රතිඵල කෙරෙහි නිසි ප්‍රතිචාර සහතික කිරීම වැනි තනි තනි සිද්ධි කලමනාකරණට හවුලේ භාවිතා කෙරෙන දත්ත පද්ධතීන්ට සහය විය හැකි අතර වැඩසටහන අධීක්ෂණය සහ ඇගයීම සඳහා වන තොරතුරු මූලාශ්‍රයක් ලෙස මහඟු සේවයක් කල හැක.

සම්බන්ධීකරණය මගින් මූල්‍ය හා මානව සම්පත් එක් රැස් කිරීම සහ ප්‍රතිචාරමය ප්‍රයත්නයන් අනිසි ලෙස පුනරාවර්තනය වීම අවම කිරීමෙන් අවම පිරිවැයකින් වැඩසටහන් වලට වැඩි බලපෑමක් මෙන්ම පුළුල් ව්‍යාප්තියක් ඇති කරයි.

ප්‍රජාවන් සම්බන්ධීකරණය මගින් වින්දිතයින් සහ අගතියට පත් අය ආරක්ෂා කිරීම සහ ඔවුන්ට උපකාර කිරීම හා අපරාධකරුවන්ට දඬුවම් දීම යන කරුණු දෙකම මගින් කාන්තාවන්ට එරෙහි හිංසනය බරපතළ ලෙස සලකන බවට පැහැදිලි, නිශ්චිත හා සාමූහික පණිවුඩ ලබා දෙයි. සම්බන්ධීකරණය මගින් වින්දිතයින් සහ අගතියට පත් අයට සහය දීම පිණිස වන සේවාවන් ලබා ගත හැකි ආකාරය පිළිබඳ ප්‍රජාවට වැඩි දැනුමක් දීය හැකි අතර කාන්තාවන්ට එරෙහි හිංසන නොඉවසීමේ පණිවුඩය දෙයි. කාන්තාවන්ට හිංසන පිළිබඳ සිය අත්දැකීම් ගැන කතා කිරිමට මෙන්ම පිරිමි සහ පිරිමි ළමුන් ඇතුළු ප්‍රජා සාමාජිකයින්ට සහ කාන්තාවන්ට සහ සිය පවුල් වලට ඉන් වන බලපෑම පිළිබඳ පැවසීමට සම්බන්ධීකරණය වැඩි ඉඩක් සපයයි. කාන්තාවන්ට එරෙහි හිංසනය මානව හිමිකම් සහ සමානාත්මතාවය පිළිබඳ ගැටළුවක් ලෙස රාමු ගත කල ප්‍රජා සහභාගීත්ව උපායමාර්ග මෙන්ම වෙනත් සමාජ සාධාරණත්ව ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරන අය සමග සහයෝගයෙන් වැඩ කිරීමට අවස්ථාව ලබා දෙයි.

මූලාශ්‍රය: කාන්තාවන්ට එරෙහි හිංසනයට මුහුණ දෙන වින්දිතයින් සඳහා වන අත්‍යාවශ්‍ය සේවා පැකේජය (5 වන මොඩියුලය - -සම්බන්ධීකරණය සහ පාලනය

## සටහන්

European Union

The Asia Foundation

WOMEN IN NEED

9 789550 168590

මෙම ප්‍රකාශනය යුරෝපීය සංගමයේ සහ ආසියා පදනමේ මූල්‍ය ආධාරයෙන් නිෂ්පාදනය කරන ලදී.